වෙනත් මෙහෙයුම් වියදම්	14	820,660,670	509,218,396
		6,585,414,855	**5,734,226,817**
මෙහෙයුම් වලින් ලද ලාභය/(අලාභය)		**(2,073,538,544)**	**(2,003,358,302)**
මූල්‍ය පිරිවැය	15	33,111,178	25,589,923
වෙනත් වියදම්	16	32,080,356	3,817,397
බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය)		**(2,138,730,078)**	**(2,032,765,622)**
ආර්ථික සේවා ගාස්තු		-	-
බදු ගෙවීමෙන් පසු ලාභය/(අලාභය)		(2,138,730,078)	(2,032,765,622)
ඉදිරියට ගෙන එන ලද ලාභ සහ අලාභ ගිණුම	17	(476,725,704)	(929,225,669)
ඉදිරියට ගෙන යන ලද ලාභ සහ අලාභ ගිණුම		**(2,615,455,782)**	**(2,961,991,291)**

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2023 රු.	2022 රු.
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්		
බදු ගෙවීමට පෙර ලාභය/(අලාභය)	303,769,922	247,234,377
පසුගිය වසර සම්බන්ධයෙන් ගැලපීම්	205,265,588	(489,039)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂ කිරීම	(375,625,320)	(516,173,075)
ක්ෂය වීම	375,625,320	516,173,075
පාරිතෝෂික ප්‍රතිපාදන	62,407,294	62,931,893
	571,442,803	**309,677,231**
කාරක ප්‍රාග්ධන වෙනස්කම් සඳහා ගැලපීම්		
ගබඩා භාණ්ඩ (වැඩිවීම්) /අඩුවීම්	(32,848,104)	(207,831,497)
ලැබිය යුතු දෑ සහ පෙර-ගෙවීම්වල (වැඩිවීම්) /අඩුවීම්	(653,316,882)	(164,140,525)
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩි (වැඩිවීම්) /අඩුවීම්	282,717,643	429,182,464
හැටන් නැෂනල් බැංකුවේ ඇමතුම් තැන්පතු (වැඩිවීම්) /අඩුවීම්		
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල්	**167,995,460**	**366,887,673**
ගෙවනලද පාරිතෝෂික	(112,457,022)	(79,529,533)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**55,538,438**	**287,358,140**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
ප්‍රාග්ධන ආධාර ලැබීම්	100,000,000	44,900,000
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම්	(54,783,634)	(11,633,803)
වර්ෂය තුළ ප්‍රාග්ධනිත කළ	(319,103,600)	(264,441,805)
සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	129,971,562	253,105,204
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(143,915,673)**	**21,929,596**
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම්/ (අඩු වීම්).	(88,377,234)	309,287,736
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	411,288,413	102,000,677
කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**322,911,179**	**411,288,413**
මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය		
අතැති සහ බැංකුවේ ඇති මුදල්	322,911,179	411,288,414
	322,911,179	**411,288,414**

4.4 ස්කන්දය වෙනස්වීමේ ප්‍රකාශනය

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2022/2023 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

	දායක ප්‍රාග්ධනය	වෙනත් සංචිත	විලම්භිත ආදායම	සමුච්චිත අතිරික්තය / හිඟය	වෙනත් පරිත්‍යාග	මුළු ශුද්ධ හිමිකම්
2022 ජනවාරි 01 දිනට ශේෂය	1,016,825,160		1,559,628,126	(928,736,626)	7,940,525	1,655,657,185
වසර සඳහා ලාභය	-	-	-	247,234,377	-	247,234,377
පෙර වර්ෂ ගැලපීම්	-		-	(489,039)	-	(489,039)
ප්‍රාග්ධන ආධාර ලැබීම්	-	-	44,900,000	-		44,900,000
වෙනත් ආධාර ලැබීම්					2,005,118	2,005,118
ක්‍රමක්ෂය	-	-	(439,115,971)	-	-	(439,115,971)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,016,825,160**		**1,165,412,155**	**(681,991,288)**	**9,945,643**	**1,510,191,670**
2022 ජනවාරි 01 දිනට ශේෂය	1,016,825,160	-	1,165,412,155	(681,991,288)	9,945,643	1,510,191,670
වසර සඳහා ලාභය	-	-	-	303,769,922	-	303,769,922
පෙර වර්ෂ ගැලපීම්	-		-	205,265,588	-	205,265,588
ප්‍රාග්ධන ආධාර ලැබීම්	-	-	100,000,000	-	-	100,000,000
වෙනත් ආධාර ලැබීම්					4,914,722	4,914,722
ක්‍රමක්ෂය	-	-	(375,625,320)	-	-	(375,625,320)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,016,825,160**	-	**889,786,835**	**(172,955,778)**	**14,860,365**	**1,748,516,582**

4.5 ශුද්ධ වත්කම් විස්තරාත්මක

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

ශුද්ධ වත්කම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2023	2022
		රු.	රු.
ප්‍රාග්ධන ප්‍රදාන			
ව්‍යාපෘතිය සඳහා ජපන් රජයෙන් ශ්‍රී ලංකා රජයට ප්‍රදාන		928,851,297	928,851,297
ජපන් ජාත්‍යන්තර සහයෝගිතාව යටතේ ලැබුණු ප්‍රදාන		50,124,930	50,124,930
විලම්බිත ආදායම (ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන)	සටහන -	889,786,835	1,165,412,155
ප්‍රාග්ධන සංචිත			
හීමෝ ඩයලිසිස් යන්ත්‍රයක් මිලදී ගැනීමට ලද පරිත්‍යාග		799,233	799,233
ජපානයේ කපිමා සංස්ථාව විසින් පරිත්‍යාග කරන ලද මෝටර් රථ සහ උපකරණ		260,000	260,000
ජපානයේ ඔලිම්පස් සංස්ථාවේ ප්‍රදාන		79,700	79,700
හෘද උරස් රෝග ඒකකය සඳහා ලද මහ බැංකු ප්‍රදාන		30,000,000	30,000,000
ජනාධිපති අරමුදලෙන් ලද ප්‍රදාන		6,710,000	6,710,000
වෙනත් පරිත්‍යාග - අරමුදල් සහ උපකරණ		14,860,365	9,945,643
		1,921,472,360	**2,192,182,958**
සටහන - ඒ			
විලම්බිත ආදායම (ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන)			
ජනවාරි 1 වැනි දිනට ශේෂය		1,165,412,155	1,559,628,126
එකතු කළා: වර්ෂය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන		100,000,000	44,900,000
අඩු කළා: ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂ කිරීම		375,625,320	439,115,971
දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය		**889,786,835**	**1,165,412,155**
විලම්බිත ආදායම (සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලද ප්‍රාග්ධන ප්‍රදාන)			
ජනවාරි 01 වැනි දිනට ශේෂය		-	75,697,104
අඩු කළා: ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂ කිරීම			75,697,104
දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය		-	-
විලම්බිත ආදායම (සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලද BMW මෝටර් රථය)			
ජනවාරි 01 වැනි දිනට ශේෂය		-	1,360,000
අඩු කළා: ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂ කිරීම			1,360,000
දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය		-	-

4.6පොදු තොරතුරු සහ සුවිශේෂී ගිණුම් පිළිවෙත් 2023

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

පොදු තොරතුරු සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2023 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

1.පොදු තොරතුරු

1.1 වාර්තාකරණ අස්ථිත්වය

මෙම වාර්තාකරණ අස්ථිත්වය වන ශ්‍රී ලංකාවේ නුගේගොඩ තලපත්පිටියේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, ශ්‍රී ලංකා පුරවැසියන් සඳහා ජපාන රජය විසින් පිරිනමන ලද පරිත්‍යාගයක් වන අතර එය *1984* සැප්තැම්බර් *17* වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
1983 අංක *54* දරණ පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකාවේ ස්ථාපිත අනෙකුත් රජයේ රෝහල්වලට සාපේක්ෂව විශිෂ්ට වෛද්‍ය සහ ශල්‍ය සේවාවන් සාමාන්‍ය ජනතාවට සාධාරණ මිලකට ලබාදීමයි රෝහල පිහිටුවීමේ මූලික අභිප්‍රාය වේ. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල ශ්‍රී ලංකාවේ රෝග නිවාරණ සෞඛ්‍ය සේවාව සැපයීමට අතිරේකව වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධිධාරීන් සහ අනෙකුත් සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීමට සහාය වීම සඳහා පිහිටුවන ලදී. මෙහි අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික සහ ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන අතර මෙහෙයුම් පාලනය කළමනාකරණ කමිටුවට පැවරී ඇත.

2. මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

2.1 ගිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ ගිණුම්කරණ සටහන්වල සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර ඇති ඓතිහාසික පිරිවැය සම්මුතියට අනුකූලව සකස් කර ඇත. එමෙන්ම මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඇත.
ආයතනය අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් සඳහා අබාධිත පවත්වාගෙන යනු ලබන බවට වන පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.2 සංසන්දනාත්මක සංඛ්‍යා

සංසන්දනාත්මක සංඛ්‍යා, යම් යම් අවස්ථා වලදී, ප්‍රවර්ථන මූල්‍ය වර්ෂයේ සංඛ්‍යා ඉදිරිපත් කිරීමේ වෙනස්කම් තහවුරු කිරීම සඳහා ගැළපුම් කර ඇත.

3. දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය අඩුකරන ලද පිරිවැයට සඳහන් කරනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය යනු වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා අවශ්‍ය එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී සිදුවන ඕනෑම වියදම් ද සහිතව ඒවා මිලදී ගැනීම හෝ ඉදිකිරීම සඳහා දරනු ලබන පිරිවැයයි. සපයනු ලබන සේවාවන් පවත්වාගෙන යාමට හෝ සපයනු ලබන සේවාවන්හි ධාරිතාව වැඩි කිරීමට ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.
සින්නක්කර ඉඩම් හැර අනෙකුත් වත්කම්වල ක්ෂය ප්‍රතිපාදන පහත සඳහන් පරිදි සරළ මාර්ග ක්‍රමය භාවිතා කර පිරිවැය මත වෙන්තරනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගුව

2023 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

3. දේපල, පිරියත සහ උපකරණ

ජපන් රජයෙන් ලද පරිත්‍යාග

ගොඩනැගිලි	2%
විදුලි වැඩ	10%
මලාපවහන සහ ජලනල	10%
වායු සමීකරණ	15%
සෝපාන/ විදුලි පඩිපෙළ	10%
ගෘහ භාණ්ඩ සහ උපාංග	13%
වෛද්‍ය උපකරණ	20%

අනෙකුත් වත්කම්

වෙනත් ගොඩනැගිලි	5%
ගෘහ භාණ්ඩ සහ උපාංග සහ අනෙකුත් උපකරණ	20%
විදුලි උපකරණ, මහන මැෂින් සහ සිලින්ඩර	10%
වෛද්‍ය උපකරණ	25%
ශීතකරණ සහ ඡායා පිටපත් යන්ත්‍ර	15%
මෝටර් රථ	20%
මෘදුකාංග (දේශීයව සංවර්ධිත)	100%

වත්කම් එය භාවිතයට තිබෙන විට ඒවායේ ක්ෂය වීම ආරම්භ වන අතර එම වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කළ දින හෝ වත්කම බැහැර කළ දින යන දෙදිනෙන් කළින් එළැඹී දිනයේ දී ක්ෂයවීම් නතර වේ.

4. ගබඩා භාණ්ඩ

ගබඩා භාණ්ඩවල දක්වා ඇති සියලුම අයිතමවල පිරිවැයට දක්වා ඇති අතර එවා පළමු ගැනුම් පළමු නිකුතු පදනම අනුව තක්සේරු කර ඇත. ශුද්ධ උපලබ්ධි අගය නිර්ණය කිරීමේ අපහසුව නිසා එය නොසලකා හැර ඇත.

5. ප්‍රදාන ගිණුම්ගත කිරීම

5.1 රජයේ ප්‍රදාන

ව්‍යවස්ථාපිත මණ්ඩලයට ලැබෙන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට, ඒ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20 හි 26 ඡේදය පරිදි කටයුතු කරනු ලැබේ.
ඒ අනුව ප්‍රාග්ධන ප්‍රදානය විලම්භීත ආදායම් ගිණුමකට බැර කර ක්ෂයවීම් අනුපාතවලට සමාන අනුපාතයකින් ක්‍රමක්ෂ කරයි. ක්‍රමක්ෂය වීමේ අනුපාතය වත්කම්වල කරන ලද ආයෝජනය සඳහා ගණනය කරන ලද ක්ෂයවීම් අනුපාතයට ආසන්න වශයෙන් සමාන වේ.

භාණ්ඩාගාරයෙන් ලද රජයෙන් පුනරාවර්තන ප්‍රදාන එම කාල සීමාවේ ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර එම නිසා එය වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ ආදායමක් ලෙස එකතු කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගුව

2023 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

6. වගකීම් සහ ප්‍රතිපාදන

6.1 විශ්‍රාම ප්‍රතිලාභ

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව, සේවකයකුට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් වන වගකීම පැන නගින්නේ සේවකයා අඛණ්ඩ සේවා වසර 5ක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. වසර පහක සේවා කාලය සම්පූර්ණ කර ඇති සියලුම සේවකයින් සඳහා අදාළ පාරිතෝෂික, මුල්‍ය වර්ෂයේ අවසාන මාසය පදනම් කරගෙන සේවකයා ලබන වැටුපන් අඩකට සමාන මුදලක් සේවකයා සේවය සපයන ලද වර්ෂගණනින් ගුණනය කර ගෙවීම සිදුකරනු ලැබේ.

6.2 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතා

(අ) ශේෂ පත්‍ර දිනට ඇති සියලුම සැලකියයුතු වියදම් බැඳීම් සහ අවිනිශ්චිත වගකීම් පහත පරිදි අනාවරණය කර ඇත.

(ආ) 2023.12.31 දිනට රෝහල් මණ්ඩලයට එරෙහිව පහත පරිදි නඩු පවරා ඇත.

අනු අංකය.	නඩු අංකය	නඩුව	මූල්‍ය බැඳීම්
01	51/68/05M	මහාචාර්ය ආර්.එල් සතරසිංහ	පිරිවැය සමග රු.මිලි.60
02	01/Add/72/2013	ඊ.එම්.කේ.බී ඒකනායක මහතා	රු.මිලි.1.8
03	02/427/2013	ලසන්ත මහතා	රු.මිලි.1.8
04	M2819/2017	උදාර හසරල්ගේ මරණය	රු.මිලි.5
05	M/2307/15	ඊ.එම්.කේ.බී ඒකනායක මහතා	ඇස්තමේන්තුකර නොමැත
06	CA (writ)116/2020	ආචාර්ය එම්.එස් බුද්ධදාස මිය	ඇස්තමේන්තුකර නොමැත
07	CA (writ)186/2020	ආචාර්ය පී.එස්.ආර් අමරතුංග මිය	ඇස්තමේන්තුකර නොමැත
08	CA (writ)79/2020	ආචාර්ය පී.යූ කෝට්ටගේ	ඇස්තමේන්තුකර නොමැත
09	CA (writ)311/2020	ආචාර්ය ඩී.එච් සමරකෝන් මිය	ඇස්තමේන්තුකර නොමැත

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලලෙහි කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය ගාස්තු සහ නොමිලේ වෛද්‍ය පහසුකම් සම්බන්ධයෙන් පිළිවෙලින් රුපියල් 4,449,091 සහ රුපියල් 5,293,440 ක අතිරේක උපයනවිට ගෙවන බදු වගකීම් තක්සේරු දෙකක් 2013/14 සහ 2014/15 වර්ෂයන් සඳහා සිදු කර ඇත. මෙම නඩුව බදු අභියාචනා කොමිසම වෙත යොමු කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගුව

2023 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

7. ආදායම සහ වියදම

7.1 ආදායම සහ වියදම හඳුනා ගැනීම

රෝහලේ ආදායමට රෝහල් ගාස්තු, රජයේ ප්‍රදාන (පුනරාවර්තන), ඇමතුම් තැන්පතු වලින් ලැබෙන පොලී ආදායම සහ සේවකයින්ට ලබා දෙන ණය සහ වෙනත් විවිධ ආදායම් ඇතුළත් වේ. සියලුම ආදායම් සහ වියදම් කාණ්ඩ උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

7.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර පිළියෙල කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ යන්නට බැංකු වල පවතින ජංගම ගිණුම් ශේෂයන් සහ පවත්වාගෙන යනු ලබන සුළු මුදල් අග්‍රිම සහ ප්‍රධාන මුදල් අග්‍රිමවලින් සමන්විත වේ.

8. විදේශ මුදල් ගනුදෙනු

විදේශ මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනුව සිදුවන අවස්ථාවේ පවතින විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

9. බදු අය කිරීම

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව ගණනය කර ඇති පරිදි ආදායම් සහ වියදම්වල මූලිකාංග මත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත. කෙසේ වෙතත්, බදු අලාභ සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොමැත.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගුව

2023 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

10. ඩයලිසිස් ආධාර අරමුදල

රෝහල විසින් රුපියල් මිලියන **12.5**ක ස්ථාවර තැන්පතුවක් සහිතව ඩයලිසිස් ආධාර අරමුදලක් පවත්වාගෙන යනු ලැබේ. ඉහත ස්ථාවර තැන්පතුවල මාසික පොලිය ඩයලිසිස් රෝගීන්ගේ අනුමත රෝහල් බිල්පත් පියවීම සඳහා යොදා ගනී.

11. සිදුකෙරෙමින් පවතින වැඩ

වාර්තා කරන දිනට ප්‍රාග්ධනීකරණය නොකළ, වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන වියදම්, කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු ලෙස දක්වනු ලබන අතර වර්ෂය තුළ සම්පූර්ණ කර භාවිතයට ගත් ප්‍රාග්ධන වත්කම් දෙපළ පිරියත සහ උපකරණ වෙත මාරු කර ඇත.

12. ආදායම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභය ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල වෙත ගලා යාමට ඉඩ ඇති ප්‍රමාණයට සහ ගෙවීම් සිදු කරන්නේ කවදාද යන්න නොසලකා ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිය ප්‍රමාණයට ආදායම හඳුනාගෙන ගනු ලැබේ. ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලයේ සාධාරණ වටිනාකම මත ආදායම මනිනු ලැබේ
තවද, පොදු කාර්ය වියදම් සහ අනෙකුත් සෘජු වියදම් සලකා බලා රෝහල් ගාස්තු ගණනය කිරීම සඳහා මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීමට අපි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත්තෙමු.

මිල සූත්‍රය

$$P = [(E_1 + E_2 + E_3 + E_4 + E_5)/5]-1$$

E1 = බිල්කළ පාරිභෝජ්‍ය
E2 = පුද්ගල පඩිනඩි
E3 = පොදුකාර්ය [පරිභෝජනය, උපයෝගිතා ගෙවීම් (පොළී පිරිවැය-පොළී ආදායම) අනෙකුත් මෙහෙයුම් වියදම්,]
E4 = ඉන්ධන (ඩීසල්, දැව් තෙල්, පෙට්‍රල්, ඛුම්තෙල්)
E5 = [(මුළු ආදායම-පුනරාවර්තන ප්‍රදානය) – (මුළු වියදම - පුනරාවර්තන ප්‍රදාන)]= ලාභ/අලාභ

13. බොල්ණය සඳහා ප්‍රතිපාදන

දෙසැම්බර් 31 වන දිනට ණය ගැනියන්ගේ ශේෂයන් මත 5%ක බොල් ණය ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ.

4. 7 ගිණුම් සඳහා සටහන් - 2023

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

දෙසැම්බර් 31 දිනට		2023 රු.	2022 රු.
සටහන: 01			
මුදල් හි මුදල් සමාන දෑ			
ලංකාබැංකු ජංගම ගිණුම අංක. 227982 (පුනරාවර්තන)		3,592,406	218,263,142
ලංකාබැංකු ජංගම ගිණුම අංක. 7732950 (ප්‍රාග්ධන)		39,090	3,046,235
ලංකාබැංකු ජංගම ගිණුම අංක. (පුනරාවර්තන)		16,370,819	50,000
ලංකාබැංකු ජංගම ගිණුම අංක. (පුනරාවර්තන)		5,040,823	157,789,453
ලංකාබැංකු ජංගම ගිණුම අංක. 2888787 (ඩයලයිසිස් අරමුදල)		2,692,010	1,758,776
හැටන් නැෂනල් බැංකුව ජංගම ගිණුම අංක .036010002853		11,613,391	10,887,440
ස්ථාවර තැන්පතු -(ලංකාබැංකුව)-ඩයලයිසිස් අරමුදල		12,500,000	12,500,000
7 දින ඇමත්ම් තැන්පතු -(ලංකාබැංකුව)- රෝහල		260,000,000	
අතැති මුදල් සහ අග්‍රිම ගිණුම		10,915,114	6,463,336
මුද්දර සඳහා සුළු මුදල් අග්‍රිම		147,526	530,031
		322,911,179	**411,288,413**
සටහන: 02			
ලැබිය යුතු සහ පෙර-ගෙවීම්			
විවිධ තැන්පතු	උපලේඛන 01	6,467,898	8,751,242
ලැබිය යුතු වෙනත් ආදායම්	උපලේඛන 02	2,805,486	3,381,160
කාර්ය මණ්ඩල ආපදා ණය		144,997,271	150,992,550
විශේෂ අත්තිකාරම්		20,517,500	
වැටුප් අත්තිකාරම්		174,500	174,500
කාර්ය මණ්ඩලය - උත්සව අත්තිකාරම්		90,000	183,438
විවිධ ණය ගැතියන්	උපලේඛන 03	422,728	422,728
ලැබිය යුතු රෝහල් ගාස්තු	සටහන 02.1	856,670,201	252,903,490
අයකර ගත යුතු මරණ පරිත්‍යාග		100,327	400,507
ලැබිය යුතු බැඳුම්කර උල්ලංඝන ගාස්තු		48,976,069	11,645,026
සෞඛ්‍ය අමාත්‍යාංශය		13,393,748	12,444,204
		1,094,615,728	**441,298,845**
සටහන 02.1			
ලැබිය යුතු රෝහල් ගාස්තු		869,565,375	257,903,490
බොල් ණය සඳහා ප්‍රතිපාදන		(12,895,174)	(5,000,000)
		856,670,201	252,903,490

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

දෙසැම්බර් 31 දිනට		2023 Rs.	2022 Rs.
සටහන:03			
ගබඩා භාණ්ඩ - ස්ථානය අනුව			
පොදු ගබඩාව		50,721,829	53,540,379
ඖෂධ ගබඩාව		63,957,612	77,423,241
ශල්‍ය පාරිභෝජ්‍ය ගබඩාව		216,471,118	162,597,500
සැරහුම් ගබඩාව		22,834,492	8,141,178
විද්‍යුත් වෛද්‍ය උපකරණ (EME) ප්‍රධාන ගබඩාව		6,058,325	6,027,638
රසායනාගාර සහ Xray ප්‍රධාන ගබඩාව		115,206,324	48,499,387
උප ගබඩාවල පොදු අයිතම (සියලු වාට්ටු සහ අනෙකුත් ස්ථාන)		61,934,542	33,028,731
උප ගබඩාවල ඖෂධ, ශල්‍ය, සැරහුම් සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය		143,549,987	234,486,056
		680,734,229	623,744,110
අඩුකළා: කල් ඉකුත්වන අයිතම සඳහා ප්‍රතිපාදන		(34,036,712)	(9,894,697)
		646,697,517	613,849,413
සටහන : 04			
කෙටිකාලීන ආයෝජන			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව (කාර්යමණ්ඩල ආරක්ෂක නැන්පතු)		20,000	20,000
		20,000	20,000
සටහන: 05			
දේපල, පිරියක සහ උපකරණ			
දේපල, පිරියත සහ උපකරණ (කරු. 15 පිටුව බලන්න)		13,235,767,229	13,342,641,948
ගෘහ භාණ්ඩ සහ උපාංග, මෝටර් රථ සහ වෙනත් (කරු. 15 පිටුව බලන්න)		42,907,635	46,852,846
සටහන: 06			
කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු	උපලේඛණය 04	87,801,364	217,772,925
		87,801,364	217,772,925
සටහන: 07			
සේවක ප්‍රතිලාභ - පාරිතෝෂිතය			
වසර මුලදී ශේෂය		709,258,157	725,855,797
වර්ෂය තුළ සැලසූ ප්‍රතිපාදන		62,407,294	62,931,893
(-) වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්		(112,457,022)	(79,529,533)
වසර අවසානයේ ශේෂය		**659,208,429**	**709,258,157**

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් හා බැඳේ

දෙසැම්බර් 31 දින වන විට		2023 රු.	2022 රු.
සටහන : 08			
වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු			
ණය හිමියන් සහ උපචිත වියදම්	සටහන 8.1	1,355,297,424	1,104,863,724
වෙනත් වගකීම්	සටහන 8.2	148,979,955	116,696,013
		1,504,277,380	**1,221,559,737**
සටහන 8.1			
ණය හිමියන් සහ උපචිත වියදම්			
උපචිත වියදම්	උපලේඛන 05	279,692,115	332,071,344
විගණන ගාස්තු (විගණකාධිපති දෙපාර්තමේන්තුව)		4,118,560	6,404,400
වෙළඳ ණයහිමියෝ		1,029,037,773	766,387,979
වෛද්‍ය සැපයුම් අංශය		42,448,977	
		1,355,297,424	**1,104,863,723**
සටහන 8.2			
වෙනත් වගකීම්			
කාර්ය සාධන/ අත්තිකාරම් බැඳුම්කර තැන්පතු	උපලේඛන 06	2,078,030	1,286,530
විවිධ ණය හිමියෝ	උපලේඛන 07	1,692,263	621,026
වෘත්තීය ගාස්තු	උපලේඛන 08	94,176,740	64,188,452
රෝහල් ගාස්තු - තැන්පතු		24,257,576	10,326,929
ගෙවිය යුතු පාරිතෝෂිතය		1,380,256	1,380,256
ඩයලිසිස් ආධාර අරමුදල් ගිණුම - (පාලන ගිණුම)		2,693,380	1,760,146
ගෙවිය යුතු රඳවා තබා ගැනීම		5,432,585	21,077,591
ටෙන්ඩර් තැන්පතු		1,961,200	1,643,465
ඩයලිසිස් ආධාර අරමුදල් ගිණුම- (ස්ථාවර තැන්පතු)		12,500,000	12,500,000
අවලංගුවූ චෙක්පත්		2,807,925	1,911,619
		148,979,955	**116,696,014**

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් හා සම්බන්ධවේ.

සටහන : **05**

දේපල,පිරියක සහ උපකරණ

ගෘහ භාණ්ඩ සහ උපාංග, මෝටර් රථ සහ වෙනත්

2023

විස්තරය	දේපල,පිරියක සහ උපකරණ								ගෘහ භාණ්ඩ සහ උපාංග, මෝටර් රථ සහ වෙනත්			
	සිත්තක්කර ඉඩම්	ප්‍රධාන ගොඩනැගිල්ල	වෙනත් ගොඩනැගිලි	ානය වීසින් පරිත්‍යාග ෂ නත් උපකරණ/ගෘහ හ	වැදලි උපකරණ	ශීතකරණ සහ ඡායාරූප පිටපත් යන්ත්‍ර	වෛද්‍ය උපකරණ සහ වෙනත් උපකරණ	එකතුව (රු.)	ගෘහ භාණ්ඩ සහ උපාංග	මෝටර් රථ	පරිගණක මෘදුකාංග සහ පාල	එකතුව (රු.)
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.		රු.	රු.	රු.	
පිරිවැය / ප්‍රත්‍යාගණනය												
ජනවාරි 1 වන දිනට	4,845,500,000	4,832,000,000	3,287,900,000	118,265,001	395,064,810	56,116,447	4,278,304,015	17,813,150,273 -	70,363,246	30,600,000	61,578,543	162,541,789 -
එකතු කිරීම්					517,845	116,700	50,514,692	51,149,237 -	2,007,898		1,626,500	3,634,398 -
මාරු කිරීම්/බැහැර කිරීම්				-	-	-		-				-
දෙසැම්බර් 31 වන දිනට	4,845,500,000	4,832,000,000	3,287,900,000	118,265,001	395,582,655	56,233,147	4,328,818,707	17,864,299,510	72,371,144	30,600,000	63,205,043	166,176,187
ක්ෂය වීම්												
ජනවාරි 1 වන දිනට 2022 වැඩිසුර අයකිරීම්		96,640,000 (78,900,603)	156,385,000 (126,208,384)	118,265,000	249,993,311	40,254,993	3,808,970,020	4,470,508,324 (205,108,987)	60,215,840	6,120,000 (4,912,767)	49,353,103	115,688,943 (4,912,767)
වසර සඳහා අය කිරීම	-	96,640,000	156,385,000		25,907,897	4,271,489	79,928,558	363,132,944	3,365,976	6,120,000	3,006,400	12,492,376
බැහැර කිරීම් මත අයකිරීම්/	-				-	-		-			-	-
දෙසැම්බර් 31 වන දිනට	-	114,379,397	186,561,616	118,265,000	275,901,208	44,526,482	3,888,898,578	4,628,532,281	63,581,816	7,327,233	52,359,503	123,268,552
ඉද්ධ පොත් වටිනාකම්												
ජනවාරි 1 වන දිනට	4,845,500,000	4,735,360,000	3,131,515,000	1	145,071,499	15,861,454	469,333,995	13,342,641,949	10,147,406	24,480,000	12,225,440	46,852,846
දෙසැම්බර් 31 වන දිනට	4,845,500,000	4,717,620,603	3,101,338,384	1	119,681,447	11,706,665	439,920,129	13,235,767,229	8,789,328	23,272,767	10,845,540	42,907,635

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් හා බැඳේ

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා		2023 රු.	2022 රු.
සටහන: 09			
ආදායම්			
රෝහල් සත්කාරයෙන් ලැබෙන ආදාය	සටහන 9.1	4,025,145,621	3,364,664,201
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		2,442,500,000	2,280,000,000
ආදායම්	සටහන 9.2	94,839,537	64,446,847
		6,562,485,158	**5,709,111,048**
සටහන 9.1			
රෝහල් සත්කාරයෙන් ලැබෙන ආදායම්			
නවාතැන් ගාස්තු		373,414,919	322,648,040
සැත්කම් ගාස්තු		326,946,027	245,920,012
විකිරණ ගාස්තු		163,221,401	122,761,753
රසායනාගාර ගාස්තු		667,461,374	718,751,905
භෞත චිකිත්සක ගාස්තු		20,258,650	16,556,945
ඖෂධ ගාස්තු		1,473,535,803	1,150,228,469
එන්ඩොස්කොපි ගාස්තු		37,771,850	18,757,003
උරස් සැත්කම් ගාස්තු		144,778,900	104,419,810
අක්ෂි පරීක්ෂණ		23,454,700	23,196,774
ලියාපදිංචිය සහ ඇතුළත් වීමේ ගාස්තු		202,002,678	157,084,568
ENT ගාස්තු		2,331,900	2,164,625
ඩයලිසිස් ගාස්තු		50,767,649	41,166,692
ඩොප්ලර් ගාස්තු		9,568,900	6,775,983
MSBE ගාස්තු		239,542,303	219,780,409
සායන ගාස්තු		51,363,721	34,743,472
ECG / EEG / EMG ගාස්තු		2,802,650	2,196,250
Echo පරීක්ෂණ ගාස්තු		12,612,150	8,549,315
E T Uගාස්තු		157,724,595	109,647,357
පෝෂණ උපදේශන ගාස්තු		274,400	183,310
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු		56,556,500	52,144,250
චර්ම රෝග ගාස්තු		5,126,400	3,304,045
Endocrinology පරීක්ෂණ ගාස්තු		3,628,150	3,683,214
		4,025,145,621	3,364,664,201
		4,025,145,621	**3,364,664,201**
සටහන 9.2			
වෙනත් ආදායම්			
ගිලන් රථ ගාස්තු		3,290,200	1,601,280
කාර්ය මණ්ඩල ආහාර වලින් ආදායම		1,650,495	1,200,245
කාර්ය මණ්ඩල කුලී සහ විදුලියෙන් ලැබෙන ආදායම		7,365,706	5,720,401
විවිධ ආදායම්		28,757,664	13,433,948
කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් නිරවුල් කරන ලද බැඳුම්කර		18,470,241	16,476,958
විකුණුම් මත කොමිස්		377,053	326,901
වැනල් ගාස්තු		6,218,738	219,900
කුලී ආදායම් - කිරි හල		144,000	144,000
කුලී ආදායම් - කොමර්ෂල් බැංකුව		360,000	360,000
කුලී ආදායම් - ඔසුසල		1,590,000	1,440,000
කුලී ආදායම් - PayGo		78,000	108,000
කුලී ආදායම් - රෝහල් සාප්පුව		6,215,500	5,378,000
කුලී ආදායම් - හැටන් නැෂනල් බැංකුව		540,000	540,000
කුලී ආදායම් - ලංකා බැංකුව		720,000	720,000
කුලී ආදායම් - මහජන බැංකුව		180,000	180,000
කුලී ආදායම් - පළතුරු යුෂ හල		860,000	720,000
කුලී ආදායම් - තැපැල් කාර්යාලය		12,000	12,000
		76,829,598	**48,581,633**

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් හා බැඳේ

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2023 රු.	2022 රු.
වෙනත් ආදායම් (ඉදිරියට)		
වෘත්තීය ගාස්තු මත 0.15% සේවා ගාස්තු	945,345	773,313
වාහන අංගනයෙන් ලැබෙන ආදායම	16,982,094	14,951,901
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ආදායම	82,500	140,000
	94,839,537	**64,446,847**

සටහන:10

පොළී ආදායම

පොලී ආදායම් යනු වෘත්තීය ගාස්තු ලෙස රෝගීන්ගෙන් එකතු කරන ලද නාවකාලික අධික අරමුදල්වලින් දින 07ක ඇමතුම් තැන්පතුවලින් ලැබෙන/උපචිත පොළිය සහ රෝහලේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ලබාදෙන ආපදා ණය සඳහා වන පොලියයි. විස්තර පහත පරිදි වේ.

ආපදා ණය	6,057,381	6,178,554
7දින ඇමතුම් තැන්පතු	10,159,582	12,291,100
පාසල් පොත්	48,870	55,785
	16,265,833	**18,525,439**

සටහන:11

ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය

මිලදී ගැනීම්

ඖෂධ	650,829,857	531,062,154
ශල්‍ය උපකරණ	716,251,407	583,524,897
සැරහුම්	129,327,561	107,742,645
වෛද්‍ය ඔක්සිජන්	39,884,302	29,614,970
රසායනාගාර රසායන ද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය	480,785,638	244,230,394
X-Ray පටල සහ රසායන	79,598,285	50,274,449
සාමාන්‍ය සැපයුම්	143,463,447	135,678,406
විදුයුත් වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව (ඊඑම්ඊ - පරිභෝජන ද්‍රව්‍ය)	-	
	2,240,140,496	1,682,127,915
එකතු කළා : ඉදිරියට ගෙන එන ලද තොග (ආරම්භක)	623,744,110	415,912,612
අඩුකළා: ඉදිරියට ගෙන යන ලද තොග (අවසාන)	680,734,229	623,744,109
	2,183,150,377	1,474,296,418
එකතු කළා: කල් ඉකුත්වූ තොග	24,142,015	
එකතු කළා : ආහාර පිරිවැය (රෝගීන් සහ කාර්ය මණ්ඩලය සඳහා)	174,609,044	134,985,123
	2,381,901,436	**1,609,281,541**

සටහන: 12

කාර්ය මණ්ඩල පිරිවැය

වැටුප් සහ දීමනා	1,622,514,799	1,748,722,543
සේ.අ.අ.	161,798,811	177,145,343
සේ.භා.අ.	40,448,225	44,286,344
අතිකාල, වැඩ මූර ගාස්තු සහ අමතර තීරුබදු ගෙවීම්	901,387,951	915,814,666
නිල ඇඳුම් දීමනාව	12,852,850	14,519,725
නිවාඩු දින ගෙවීම්	-	50,000,000
විශ්‍රාම වැටුප් දායකත්වය	9,643,871	9,392,794
ගමන් වියදම්	956,764	1,098,546
	2,749,603,270	**2,960,979,961**
එකතු කළා: අනෙකුත් කාර්ය මණ්ඩල සම්බන්ධ වියදම්		
නොමිලේ වෛද්‍ය ප්‍රතිකාරවල පිරිවැය - කාර්ය මණ්ඩලය/ යැපෙන්නන්	103,269,308	172,451,011
S P C -නොමිලයේ වෛද්‍ය ඖෂධ	87,450,960	72,467,921
සේවක සුබසාධනය	395,500	262,350
මානව සම්පත් සංවර්ධන වියදම්	33,600	151,900
පාරිතෝෂික ප්‍රතිපාදන	66,474,791	65,691,673
	3,007,227,428	**311,024,855**

සටහන:13

ක්ෂය

වසර සඳහා ක්ෂය	(යොමු සටහන : 05)	375,625,320	516,173,075
		375,625,320	**516,173,075**

සටහන:14

වෙනත් මෙහෙයුම් වියදම්

(අ) ඉන්ධන		
බොයිලේරු	47,384,935	59,053,781
මෝටර් රථ	4,299,364	4,987,607

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් හා බැඳේ

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2023 රු.	2022 රු.
වෙනත් මෙහෙයුම් ව්‍යදම් (ඉදිරියට..)		
(ආ) උපයෝගිතා සේවා		
විදුලි ගාස්තු	262,020,823	150,194,045
ජල ගාස්තු	78,133,247	53,643,934
දුරකථන ගාස්තු (සන්නිවේදනය)	4,029,023	3,128,881
	344,183,093	**206,966,860**
(ඇ) අලුත්වැඩියා සහ නඩත්තු		
සැපයුම්කරුවන් සමඟ අත්සන් කරන ලද සේවා ගිවිසුම්	82,282,111	74,968,572
මෝටර් රථ අලුත්වැඩියා කිරීම	6,925,611	5,511,326
වෛද්‍ය උපකරණ/අනෙකුත් උපකරණ අලුත්වැඩියා කිරීම (බිඳවැටීම් මත)	61,407,610	26,264,885
වාහනේ ගෘහ භාණ්ඩ අලුත්වැඩියා කිරීම	-	8,100
ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම	893,087	1,608,675
	151,508,419	**108,361,558**
(ඇ) වෙනත් සේවා		
සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා	63,161,614	35,806,652
රෝහල් භූමි අලංකරණය	14,895,627	12,997,591
කසළ බැහැර කිරීමේ සේවාව	6,318,000	4,489,000
හිමිකම් නොපැ මළ සිරුරු ඉවත් කිරීම	527,500	588,000
මලාපවහන මාර්ගය නඩත්තු කිරීම	17,355,834	14,693,763
රෙදි සෝදන සේවා	16,690,935	17,390,000
ආරක්ෂක සේවා	23,764,840	23,085,889
බලපත්‍ර සහ රක්ෂණය	836,849	780,537
නීතිමය ගාස්තු	305,152	458,080
විගණන ගාස්තු	2,500,000	2,500,000
විනය පටිපාටික ව්‍යදම්	348,085	509,425
තැපැල් සහ මුද්දර	1,102,965	919,900
සංග්‍රහ	973,390	402,473
කාරක සභා සහ මණ්ඩල සඳහා දීමනා	2,647,300	1,968,140
රෝහල් ගාස්තු නිදහස් කිරීම් - (ප්‍රජා පක්ෂය /වෙනත්)	106,400,447	60,490,034
වෙළඳ දැන්වීම් සහ අලෙවිකරණය	6,477,145	2,970,947
ක්‍රීඩා සමාජය	38,200	13,600
විවිධ ව්‍යදම්	6,932,280	8,265,898
වරිපනම් හා බදු	2,008,696	2,008,696
	273,284,858	**190,338,625**
	820,660,670	**569,708,431**
සටහන: **15**		
මූල්‍ය පිරිවැය		
බොල් ණය සහ අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන	-	
බැංකු ගාස්තු	43,250	36,410
ණය පත් කොමිස්	33,067,928	25,553,513
	33,111,178	**25,589,923**
සටහන: **16**		
වෙනත් ව්‍යදම්		
ආදායම් ගැලපීම් - හර සටහන / බැර සටහන	26,166,147	
බාහිර රසායනාගාර පරීක්ෂණ ගාස්තු	5,914,209	3,817,397
	32,080,356	**3,817,397**
සටහන: **17**		
සමුච්චිත අරමුදල		
ලාභ සහ (අලාභ) ගිණුම් ජනවාරි 1	(681,991,292)	(928,736,630)
පෙර වර්ෂ සඳහා ගැළපුම්	205,265,588	(489,039)
ඉදිරියට ගෙන ආ ලාභ සහ අලාභ ගිණුම් (ගැලපුම්)	(476,725,704)	(929,225,669)
ආදායම් ප්‍රකාශය අනුව ලාභය /(අලාභය)	303,769,922	247,234,377
වසර අවසානයේ ලාභ සහ අලාභ ගිණුම්	**(172,955,782)**	**(681,991,292)**

4. 8 මූල්‍ය ප්‍රකාශන සඳහා උප ලේඛන- 2023

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට)

උපලේඛන : 01

විවිධ තැන්පතු

දිනය	වවුචර් අංකය	විස්තරය	ගණන රු.
84.09.04	24	විදුලි සංදේශ - T C තැන්පතු	3,000
84.11.30	136	කොළඹ ගෑස් සහ ජල සමාගම	24,000
84.12.05	139	කොළඹ ගෑස් සහ ජල සමාගම	6,000
85.01.15	24	විදුලි සංදේශ - තැන්පතු	450
85.05.21	628	විදුලි සංදේශ - තැන්පතු	150
85.05.18	919	විදුලි සංදේශ - තැන්පතු	150
86.06.18	920	විදුලි සංදේශ - තැන්පතු	150
85.06.18	921	විදුලි සංදේශ - තැන්පතු	150
85.07.08	1091	ලංකා බල්බ් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්	80
85.08.05	1375	විදුලි සංදේශ - තැන්පතු	150
86.01.01	146	විදුලි සංදේශ - තැන්පතු	250
86.01.01	147	විදුලි සංදේශ - තැන්පතු	250
86.07.29	2017	විදුලි සංදේශ - තැන්පතු	150
86.07.24	1969	කොළඹ ගෑස් සහ ජල සමාගම	19,500
87.01.08	50	විදුලි සංදේශ - තැන්පතු	150
87.09.01	2851	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	4,000
87.01.06	3287	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	54,000
89.05.16	1869	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	35,000
89.05.20	1984	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	22,000
89.11.14	4225	කොළඹ ගෑස් සහ ජල සමාගම	25,000
89.12.28	4859	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	8,500
89.12.28		ලංකා විදුලිබල මණ්ඩලය	600,000
90.03.12	995	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	15,000
90.08.29	3507	කොළඹ ගෑස් සහ ජල සමාගම	5,000
90.08.29	3372	කොළඹ ගෑස් සහ ජල සමාගම	25,000
91.04.29	1992	විදුලි සංදේශ - තැන්පතු	25,000
92.03.14	1219	ජා.ජ. හා ජලාපවහන මණ්ඩලය	16,053
		තැපැල්පති - තැන්පතු ෆ්‍රැන්කිං යන්ත්‍රය	90,265
92.12.31	6070	ලංකා විදුලිබල මණ්ඩලය	1,672,000
90.03.12	1018	කොළඹ ගෑස් සහ ජල සමාගම	10,000
95.06.07	5965	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	1,500
95.09.14	6063	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම	1,500
96.01.29	463	ආචාර්ය ජේ බී පීරිස් - IDD තැන්පතු	5,000
96.07.02	4934	සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම- තැන්පතු	11,000
		සීමාසහිත ලංකා ඔක්සිජන් සමාගම- තැන්පතු	500,000
		C E B - අත්තිකාරම් - හෘද මධ්‍යස්ථානය	937,500
		නියෝජිත තැපැල් කාර්යාලය	10,000
2016		ආපසු ගෙවිය යුතු තැන්පතු - හිස් බහාලුම් සඳහා	1,200,000
		ආපසු ගෙවිය යුතු තැන්පතු - හිස් බහාලුම් සඳහා	300,000
2018		පිරිමි හෙදියන් සඳහා කුලියට ගත් නිවස කුලී තැන්පතු	240,000
		බහාලුම් සඳහා තැන්පතු	100,000
2023		ඉන්ධන තැන්පතු - මහරගම නව පිරවුම්හල	500,000
			6,467,898

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට) හා බැඳේ

උපලේඛන : 02

අනෙකුත් ලැබියයුතු ආදායම්

සමාගම	බාණ්ඩය	වර්ෂය	මාසය	ගණන රු.	
ලංකා බැංකුව	විදුලිය				
	කුලී	2021	දෙසැ.	20,000	20,000
ජා.ප.ස.ම	විදුලිය	2009		5,553	
		2017		31,457	
		2019	ඔක්/නොවැ/දෙසැ	14,362	
		2021	ජූනි-දෙසැ.	15,252	
		2023	නොවැ/දෙසැ	25,668	
	කුලී	2021	ජූනි-දෙසැ.	36,000	128,292
රා.ඖ.ස.සං	කුලී	2023		1,590,000	
			2019/2020	197,000	
	විදුලිය	2021	සැප්-දෙසැ	62,141	1,849,141
පළතුරු යුෂ වෙළඳසැල	විදුලිය	2017	දෙසැ.	9,415	
		2023	සැප්-දෙසැ	49,352	
	කුලී	2023	දෙසැ.	80,000	138,767
ආහාර වෙළඳසැල	විදුලිය	2022	නොවැ/දෙසැ	5,028	
		2023	දෙසැ.	6,716	11,744
සිල්ලර භාණ්ඩ වෙළඳසැල	විදුලිය	2023	නොවැ/දෙසැ	28,616	28,616
පේස්ට්රි වෙළඳසැල	විදුලිය	2017	දෙසැ.	3,702	
		2023	අගෝ- දෙසැ	202,902	206,604
කොමර්ෂල් බැංකුව	විදුලිය	2023	අගෝ- දෙසැ	47,834	
	කුලී	2023	දෙසැ.	30,000	77,834
මහජන බැංකුව	විදුලිය	2020	ඔක්- දෙසැ.	12,517	
		2023	අගෝ- දෙසැ	81,010	
	කුලී	2023	දෙසැ.	15,000	108,527
PayGo	කුලී	2022	දෙසැ.	42,000	42,000
		2023	දෙසැ.	6,000	6,000
තැපැල් කාර්යාලය	කුලී	2022	නොවැ/දෙසැ	1,000	1,000
		2023	නොවැ/දෙසැ	2,000	2,000
මොබිටෙල් සමාගම	විදුලිය	2020	ජූනි- දෙසැ.	56,999	56,999
අවලංගු කරන ලද චෙක්පත් ගිණුම- ලැබියයුතු ආදායම්					128,468
					2,805,992

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට) හා බැඳේ

උපලේඛන : 03

විවිධ තැන්පතු

විස්තරය	රු.
සෞඛ්‍ය අමාත්‍යාංශය - දේපල ණය පොලී	87,416
සෞඛ්‍ය අමාත්‍යාංශය- දුරකථන දීමනා	60,000
සෞඛ්‍ය අමාත්‍යාංශය - දේපල ණය පොලී - 2022	275,311
	422,727

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට) හා බැඳේ

උපලේඛන : **04**

කෙරීගෙනයන ප්‍රාග්ධන වැඩ

ව්‍යාපෘතිය	2023/01/01 දිනට ශේෂය	ප්‍රාග්ධනීත කළ සහ මාරු කළ	ගෙවීම් / රඳවාගැනීම්	2023/12/31 දිනට ශේෂය
උණුසුම් තාප පද්ධතිය - ගෙවන වාට්ටු	9,970,852.62	9,970,852.62		-
පොදු වැසිකිලි ඉදිකිරීම	80,048,896.30	80,048,896.30		-
උණු වතුර පද්ධතිය	23,378,041.59	23,378,041.59		-
වැඩමුළු ගොඩනැගිල්ල ඉදිකිරීම	76,877,162.00			76,877,162.00
මුල් ලංසු ලේඛනය - ම.ඉ.උ.කා.	118,039.84	118,039.84		-
රික්ත පද්ධති වායු පයිප්ප - OT/CU/ LR	9,017,571.50	9,017,571.50		-
සැලසුම් අනුමැතිය - C Arm Room	8,907.06	8,907.06		-
සවලීකරණ අත්තිකාරම් - හ.ප්‍ර.ඒ හා බිම්මහල අ	8,326,769.70	8,326,769.70		-
ලංසු සුරැකුම් - ශ්‍රී ලංකා නාවික හමුදාව	362,280.44			362,280.44
සවලීකරණ අත්තිකාරම් - වැඩමුළු ගොඩනැගිල්ල	7,106,554.33			7,106,554.33
සවලීකරණ අත්තිකාරම් - වැසිකිලි - 1 සිට 17	2,557,849.43	2,557,849.43		-
වෛද්‍ය උපකරණ පිරිසිදු කිරීම			3,456,545.50	3,456,545.50
	217,772,924.81	**133,426,928.04**	**3,456,545.50**	**87,802,542.27**

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට) හා බැඳේ

උපලේඛන : 05

උපචිත වියදම්

විස්තරය	රු.
වියළි සලාක	25,519,854.15
ආරක්ෂක සේවය	9,902,016.42
රෙදි සේදීම් සේවාව	1,450,000.00
සනීපාරක්ෂක සහ භූමි අලංකරණ සේවාව	12,204,438.00
මලාපවහන නඩත්තු සේවාව	4,008,156.50
කසළ බැහැර කිරීමේ සේවාව	526,500.00
හිමිකම් නොපාන මළ සිරුරු බැහැර කිරීමේ සේවාව	42,500.00
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - කාර්ය මණ්ඩල බිල්පත්	47,969,170.56
උප.ගෙ. බදු	13,433,216.25
ගෙවිය යුතු මුද්දර ගාස්තු	338,150.00
සේවා ගිවිසුම් - ජනවාරි/ පෙබරවාරි ගෙවූ	14,393,782.62
සේ.අ.අ. සහ සේ.හා.අ.	28,001,738.63
පුද්ගල වැටුප් - ජනවාරි/ පෙබරවාරි ගෙවූ	6,885,319.62
දැන්වීම් සඳහා ගෙවීම්	453,238.00
පුද්ගල වැටුප් - වැටුප් අංශයෙන් ලද	109,139,815.00
ඉන්ධන - මෝටර් රථ	106,621.47
අලුත්වැඩියා - උපකරණ	2,057,375.00
භාණ්ඩ පරීක්ෂණාගාර පරීක්ෂණ ගාස්තු	752,593.50
සන්නිවේදන වියදම්	512,300.85
විවිධ වියදම්	931,500.00
නෛතික ගාස්තු	7,500.00
අලුත්වැඩියා - මෝටර් රථය	487,146.24
ගමන් වියදම් සහ යැපුම් දීමනා	22,180.17
විදුලි වියදම - පොම්පාගාරය	547,002.02
	279,692,115.00

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට) හා බැඳේ

උපලේඛන : 06

කාර්ය සාධන තැන්පතු

විස්තරය			රු.
මුදල් අයකැමියන් විසින් තැන්පත් කරන ලද මුදල්			
	එන් ලසන්ත	5,000.00	
	අයි ජී නන්දසිරි	5,000.00	
	ඩී විතාන	5,000.00	
	ඊ එම් කේ බී ඒකනායක	5,000.00	
	ජී එන් පී විජේරත්න - 2014	5,000.00	25,000.00
සිල්ලර බඩු වෙළඳ සැල - මාස 3ක කුලී තැන්පතු		2023	708,000.00
පෙරේරා සහ පුත්‍රයෝ - මාස 3ක කුලී තැන්පතු		2019	450,000.00
ක්වික් ලිනන් වොෂින් - ඇප තැන්පතු		2019	20,000.00
පළතුරු යුෂ වෙළඳ සැල - මාස 3ක කුලී තැන්පතු		2021	180,000.00
සිල්ලර බඩු වෙළඳ සැල - ඇප තැන්පතු -		2020	25,000.00
වෙන්චර් සිලෝන් හෝල්ඩිං - Q/27/18 - බැඳුම්කර තැන්පතු			42,030.00
රිබෙල් වෙෆ්	මාස 3ක කුලී තැන්පතු	2023	60,000.00
ආහාර වෙළඳසැල	මාස 3ක කුලී තැන්පතු	2023	543,000.00
ආහාර වෙළඳසැල	ඇප තැන්පතු	2023	25,000.00
			2,078,030.00

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ උපලේඛන (2023/12/31 දිනට) හා බැඳේ

උපලේඛන : **07**

විවිධ ණයහිමියෝ

විස්තරය		රු.	රු.
පැලවත්ත සීනි සංස්ථාව	රෝහල් ගාස්තු සඳහා තැන්පතු		25,000.00
ඕවසීස් ළමා පාසල් තැන්පතු	රෝහල් ගාස්තු සඳහා තැන්පතු		20,100.00
ඉන්ටර්නැෂනල් ඉරිගේෂන්-IIMI	රෝහල් ගාස්තු සඳහා තැන්පතු		10,000.00
ලංකා හෝටල් සංස්ථාව	රෝහල් ගාස්තු සඳහා තැන්පතු		50,000.00
ලංකා වෝල්ටයිල් සමාගම	රෝහල් ගාස්තු සඳහා තැන්පතු		50,000.00
ගෙවිය යුතු පාරිතෝෂිතය			230,675.07
ගෙවිය යුතු පාරිතෝෂිකය - T A M පීරිස් - EPF 1763			750.00
ගෙවිය යුතු පාරිතෝෂිතය			205,201.00
ආදරණීය අම්මී පොත			27,300.00
සුළු මුදල් - සැපයුම් කාර්යාලය			100,099.74
විශේෂ ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල්			971,137.50
ඩයලයිසිස් අරමුදල - ණයහිමියෝ			2,000.00
			1,692,263.31

උපලේඛන : **08**

ගෙවිය යුතු වෘත්තීය ගාස්තු

විස්තරය	රු.
ඉදිරියට ගෙන ගිය ශේෂය	3,616,142.00
2019 - 2023 වසර සඳහා ගෙවිය යුතු	90,560,598.42
	94,176,740.42

5. විගණන වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඑවිඕ/ඒ/එස්ජේජීඑච්/එෆ්ඒ/2023/01

මෙම අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 ජූලි 05 දින

සභාපති
ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව· යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මහාරෝගාශාලා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂයසඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 48 ඡේදය ප්‍රකාරව,ප්‍රමිතිය මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් මෙන්ම ආදායම් හා වියදම් නිලව් නොකල යුතු වුවද, සමාලෝචිත වර්ෂය රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල රු.මිලියන 1.71ක බැර ශේෂ රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල හර ශේෂ වලින්ද, වෙළඳ ණයහිමියෝ හර ශේෂ රු.මිලියන 2.2ක් වෙළඳ ණයහිමි බැර ශේෂවලින්ද හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. පෙර වර්ෂවලදීද මේ පිළිබඳ කරුණු හෙළිදරව් කර තිබුණද තිබුණද අවශ්‍ය නිවැරදි කිරීම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.මිලියන 205.26ක ශේෂයක් ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌණතාවයට ගලපා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 4,347.17ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රෝහල සතු ඉඩමේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10.0229ක් වුවද ඉන් හෙක්ටයාර් 9.8047ක් පමණක් 2022 වර්ෂයේදී රු. මිලියන 4,845.5කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර හෙක්ටයාර් 0.2182ක භූමි ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රෝහල් බිල්පත්වල වැරදි නිවැරදිකිරීම සඳහා යොදන ලද එකතුව රු.මිලියන 4.95ක් හා රු.මිලියන 31.12ක් වූ පිළිවෙලින් හරපත් හා බැරපත්වල අගයන් අදාල ආදායම් ගිණුම්වලට ගැලපීම් කිරීම වෙනුවට රු.මිලියන 26.17ක් වූ එම ශේෂයන්හි වෙනස ආදායම් ගැලපුම් (Income Adjustment) ලෙස විවිධ වියදම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 19දෙනෙකුගෙන් ලැබියයුතු බැඳුම්කර ආදායම රු.මිලියන 33.22ක් වුවද රු.මිලියන 37.33ක් ලෙස ගිණුම්ගතකිරීම හේතුවෙන් ලැබියයුතු බැඳුම්කර ආදායම් (ජංගම වත්කම්) හා වර්ෂයේ ලාභය රු.මිලියන 4.11ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 19දෙනෙකුගෙන් අයවිය යුතු ගෙවූ වැටුප්වල එකතු අගය රු.මිලියන 31.03ක් පෙර වර්ෂ ගැලපීමක් ලෙස සලකා වැරදි ආකාරයට බැඳුම්කර ආදායම් ගිණුමට හර කර සමුච්චිත ලාභාලාභ ගිණුමට බැරකර තිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයේ බැඳුම්කර ආදායම හා ලාභය එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 15දෙනෙකුගෙන් අයකර ගන්නා ලද රු.මිලියන 15.80ක මුදල වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීමකින් තොරව පෙර වර්ෂ ගැලපීමක් ලෙස සලකා සමුච්චිත ලාභාලාභ ගිණුමට බැරකර තිබුණි. ඒ අනුව වර්ෂයේ බැඳුම්කර ආදායම හා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීමේ නිශ්චිත හා නිසි ක්‍රමවේදයක් මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු අතර වෘත්තිය ගාස්තු ආදායම වූ රු.මිලියන 653.93ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර, සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ගෙවා තිබුණු වෘත්තිය ගාස්තු රු.මිලියන 623.94ක් එම ගිණුමට හර කර තිබුණි. 2023 දෙසැම්බර් මාසයට අදාලව ණය ලිපි (Credit Letter) මත රෝහලින් බැහැරව යන රෝගීන්ගේ රෝහල් ගාස්තු හා වෘත්තිය ගාස්තු ලෙස රෝහල් ගාස්තු ආදායම් ගිණුමෙන් රු.මිලියන 62.84ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර තිබුණි.

ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමේ 1998 වර්ෂයේ සිට පවතින රු.මිලියන 3.62 ක්වූ ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ගිණුමේ තවදුරටත් රු.මිලියන 27.72ක ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ශේෂයක් වුවද එම ශේෂය තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඒ) පෙර වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල්ඉකුත් වූ ඖෂධ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 9.89ක් හා රු.මිලියන 24.14ක් ලෙස එකතුව රු.මිලියන 34.03ක වෙන්කිරීමක් සිදුකර තිබුණද, කල් ඉකුත් වූ ඖෂධවලට අදාල වෙන්කිරීම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් රෝහල විසින් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල එකතුව රු.මිලියන 39.89ක් වූ විදුලිය හා ජල බිල්පත් වටිනාකම උපචිත වියදම් ලෙස ගැලපීම් නොකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) දහන යන්ත්‍රයේ (Incenerator) සේවා ගිවිසුම ප්‍රකාරව 2023 ඔක්තෝබර් 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද සේවා මුදලින් 2024 වර්ෂයට අදාල රු.මිලියන 2.17ක මුදල ඉදිරියට ගෙවීම් ලෙස හඳුනාගැනීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2023 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, රෝහල් ගාස්තු ණය ගැතියෝ හා ව්‍යාධිවේදී රසායනාගාර අත්තිකාරම් යන විෂයයන් 03කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු හා ලේඛන අනුව වටිනාකම අතර රු.මිලියන 56.77 වෙනසක් වූ අතර එම වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(ග) 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,899.55ක් වූ ණයහිමියෝ, රෝහල් ගාස්තු ණය ගැතියෝ හා සේවා ගාස්තු යන ගිණුම් විෂයයන් 03ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සහ උපයෝගී ලේඛන ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීම හෝ සන්නිරීක්ෂණය කිරීම හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

(ච) තොග සම්බන්ධ පරිගණක (Systolic) පද්ධතියේ සිදුවන භාණ්ඩ ලැබීමේ පත්‍ර(GRN) ඉවත් කිරීම් ගිණුම්කරණ පරිගණක පද්ධතිය (Accpac) තුළ යාවත්කාලීන නොවීම, ගිණුම්කරණ පරිගණක පද්ධතියේ භාණ්ඩ ලැබීමේ පත්‍ර දෙවරක් සටහන් වීම සහ අගයන් වෙනස් වී සටහන්ව තිබීම, ගිණුම්කරණ පරිගණක පද්ධතියෙන් මුදල් ගෙවීම සිදු වුවත් එම ගෙවීම් කේවල ණයහිමි ශේෂ වලට ගලපා නොතිබීම, කේවල ණයහිමි ශේෂ තුළ දඩ මුදල්, ප්‍රමාද ගාස්තු ගැලපුම් සිදුකර නොතිබීම හා කේවල ණයගැති ශේෂ වලට අදාලව මුදල් ලැබීම් නිසි පරිදි ගැලපීම් නොකිරීම යනාදී හේතු මත වෙළඳ ණයහිමි හා වෙළඳ ණයගැති ශේෂවල සිදුවී ඇති වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් වවුචර් පිළියෙල කිරීමකින් තොරව හරපත් හා බැරපත් මගින් 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ශේෂය රු.මිලියන 22.73ක් සමුච්චිත ලාභලාභ ගිණුමට ගැලපීම් කර තිබුණි.

(ජ) ණයගැති ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව බොල් ණය සඳහා පිළිගත් ක්‍රමවේදයට අනුව සියයට 5ක් වෙන් කිරීම් කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස රු.මිලියන 6.3ක් වැඩියෙන්

බොල් ණය වෙන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ට) වැඩ ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් රු.මිලියන 7.11ක් අත්තිකාරම් ලෙස නොදක්වා මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා තිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද එකතුව රු.මිලියන 3.12ක් වූ වෛද්‍ය උපකරණ, ලී බඩු හා සවිකිරීම් අගය පරිත්‍යාග ගිණුමට බැර කිරීම වෙනුවට ණයහිමි ශේෂයක් ලෙස දැක්වීම හේතුවෙන් පරිත්‍යාග එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මකකරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 මෙම වාර්තාවේ 1.2(අ), (ඇ) හා (ඈ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය

විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති/ විධානයට යොමුව	**අනුකූල නොවීම**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
	II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති	කාර්ය මණ්ඩලයේ සෑම සේවයක හා ශ්‍රේණියක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, මේ දක්වාම බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 103 සහ 104	වාහන අනතුරු හේතුවෙන් සිදුවන අලාභ සම්බන්ධයෙන් ඊට වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු වුවද රෝහලේ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 110	සෑම ආයතනයක් විසින්ම සිදුවන හානි වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ආකෘතිය ප්‍රකාරව හානි ලේඛනයක් පවත්වා ගත යුතු වුවද රෝහලේ වාහන සම්බන්ධයෙන් නිසි ආකෘතිය පරිදි සකස්කල හානි ලේඛනයක් පවත්වා නොතිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 1642	ආයතනයේ වාහන භාවිතා කරනු ලබන නිළධාරීන් විසින් හෝ ඔවුන් නොමැති අවස්ථාවන්හිදී ඒ වාහනවල රියදුරන් විසින් සිදුවන සියළුම හදිසි අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඇ)	2016 ඔක්තෝබර් 10 දිනැති අංකDMS/1758-Vol.1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය.	අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) රෝහල විසින් 2022 ඔක්තෝබර් සිට ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා එකතු කල අගය මත බදු ලෙස සියයට 15 ක බදු ප්‍රතිශතයක් රෝගීන්ගේ බිල්පත්වලින් අයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) 2022 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතු කල අගය මත බදු ලෙස අයකල රු.මිලියන 21.21ක් සම්බන්ධයෙන් 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 3 පරිච්ඡේදයේ 21 වගන්තිය පරිදි කාර්තුමය වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) රෝහලේ ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා පමණක් එකතු කල අගය මත බදු අයකර තිබුණද පනතේ විධිවිධානවලට අනුව එම ආදායමෙන් ඊට අදාලව ගෙවන ලද එකතු කල අගය මත බදු පමණක් හිලව් කරගැනීමෙන් තොරව අයකල සම්පූර්ණ බදු මුදලම ගෙවූ බදුවලට හිලව් කරගෙන තිබුණි.

(iii) 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී යටෝක්ත පනතේ 26 වගන්තියට අනුකූල නොවීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණු එකතුව රු.මිලියන 5.2 ක දඩ මුදල සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණද එම දඩ මුදල නිදහස් කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) රෝගීන්ගේ රෝහල් බිල්පත් සඳහා මුදල් අයවීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) නිශ්චිත පදනමකින් තොරව ඉහළ කළමණාකාරීත්වයේ අනුමැතීන් මත ඇතැම් රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ගෙවීම්වලින් නිදහස් කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතුව රු.මිලියන 28.82ක බිල්පත් නිදහස් කර තිබුණු අතර 2017 වර්ෂයේදී බැරපත් මගින් මෙම ගිණුම්වලින් එකතුව රු.මිලියන 6.4ක බිල්පත් ඉවත්කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) රෝහල් ගාස්තු බිල්පත් නොගෙවා රෝහලෙන් බැහැරවූ රෝගීන්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 23.07ක ණයගැති ශේෂයක් පැවති අතර මෙම බිල්පත්වල වටිනාකම රු.360 සිට රු.මිලියන 2.04 දක්වා වූ පරාසයක විය. රෝගීන් රෝහලෙන්

බැහැරවයාමේදී රෝහල් ගාස්තු අයකර නොතිබීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(iii) තොග හා බිල්පත් පිළිබඳ (Systolic) පරිගණක පද්ධතියේ තොරතුරුවලට අනුව ප්‍රතිකාර ගෙන රෝහලින් බැහැරව ගිය එහෙත් බිල්පත් පියවා නොතිබුණු රෝගීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 2.05ක රෝහල් ගාස්තු බිල්පත් පැවති අතර බිල්පත් නොගෙවා රෝගීන් රෝහලින් බැහැරවී තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(iv) රෝහලින් බැහැරව ගිය එහෙත් අවසාන බිල්පතක් සකස්කර නොතිබුණු රෝගීන් 08 දෙනෙකුටපරිගණක පද්ධතිය තුළ දෛනිකව බිල් සැකසෙමින් පැවති අතර 2024 මැයි 03 දින වනවිට එම බිල්පත්වල එකතු අගය රු.මිලියන 35.72ක් විය. මෙම රෝගීන් හඳුනාගෙන රෝගී සත්කාර වෙනුවෙන් අයවිය යුතු රෝහල් ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) ණය ලිපි (Credit Letters) ඉදිරිපත් කර රෝහලින් බැහැරව ගිය රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අදාල රක්ෂණ ආයතන හෝ සේවා ආයතන වෙතින් ප්‍රතිපූර්ණය නොවීමෙන් ආයතන 09කින් අයවිය යුතු රු. මිලියනය ඉක්මවූ දින 90කට වැඩිකාලයක සිට පැවතෙන එකතුව රු.මිලියන 29.62ක ණයගැති ශේෂයක් පැවතුණි.

(ඇ) 2021, 2022 හා 2023 වර්ෂ තුළ වෘත්තිය ගාස්තු ලෙස ගෙවන වාට්ටුවලට අදාලව වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය වෙත ගෙවූ මුදල හා එම වාට්ටුවලින් රෝහල වෙත ලැබුණු ආදායම පිළිවෙලින් රු. මිලියන 648.3 ක්, 857.5 ක් හා 1,111.6 වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිභාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි අයකරන ගාස්තු තීරණය කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව බිල්පත් වට්නාකමෙන් සියයට 24 සිට සියයට 89 දක්වා වූ පරාසයක වෘත්තිය ගාස්තු අයකර තිබුණි.

(ii) වෛද්‍ය නිලධාරීන් විසින් නිවාඩු දින දීමනා ලබාගත් කාලසීමාව තුළ පෞද්ගලික සේවයේ යෙදී වෘත්තිය දීමනාද අයකර තිබුණු අතර නියැදි විගණන පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ වෛද්‍ය නිලධාරීන් 07 දෙනෙකු විසින් එසේ වෘත්තිය දීමනා ලෙස අයකර තිබුණු මුදල රු.මිලියන 1.52ක් විය.

(iii) 1984 ජූලි 18 දිනැති අංක අමප/1984/335(2) දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2000 නොවැම්බර් 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී වේලාව තුළ ගෙවන වාට්ටුවල රෝගීන් සඳහා සිදුකරන ශල්‍යකර්ම වෙනුවෙන් වෘත්තීය ගාස්තු අය කළ නොහැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව එසේ වෘත්තීය ගාස්තු ලෙස අය කර තිබුණු මුදල රු.මිලියන 4.91ක් විය.

(iv) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා 2023 වර්ෂයේදී වෘත්තීය ගාස්තු ලෙස රු.මිලියන 60.73ක් ගෙවා තිබුණි.

(v) රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා වෘත්තිය ගාස්තු අයකිරීමට නිසි අනුමැතියකින් තොරව හා විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රෝහල් කාර්යමණ්ඩලය තුළ නොවන බාහිර වෛද්‍යවරුන් 08 දෙනෙකු රෝහලේ සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදු කර වෘත්තීය ගාස්තු ලෙස එකතුව රු.මිලියන 11.98ක් රෝගීන්ගෙන් අය කර තිබුණු අතර ඉන් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් ගෙවා තිබුණි.

(vi) 2023 වර්ෂය තුළදී කාර්යමණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 601.74කින් මණ්ඩලයේ ආදායමට බැරකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.945,345ක් පමණක් විය. 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවත්නා වෘත්තිය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර කාලානුරූපීව අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට රෝහල් පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි.

(vii) රෝහල විසින් වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා ගෙවනු ලබන වෘත්තිය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අඩු කිරීමකින් තොරව 2023 ජුනි 08 දිනැති අංක S.B.M 1.4 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2022 දෙසැම්බර් 22 දිනැති අංක. SEC/2022/E/03 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය පදනම් කරගෙන රු. 100,000 කට වැඩි වෘත්තිය ගාස්තු ගෙවීම් මත 2023 ජනවාරි මාසයේ සිට සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පමණක් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. එහෙත් රෝහලේ අභියාචනාවකට අදාලව බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2024 අප්‍රේල් 10 දිනැතිව ලබාදී තිබුණු වාර්තාව අනුව වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගෙවිය යුතු බවට රෝහල වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013/2014 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රෝහලේ වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ස්ථීර වශයෙන් නිලධාරියෙකු පත්කරනතෙක් රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා නිත්‍ය තනතුරේ වැටුපෙන් ¼ ක රාජකාරී ආවරණය කිරීමේ දීමනාවක් ගෙවීමට යටත්ව වැඩ ආවරණය කිරීමේ පදනම මත 2021 ජූලි 28 දින සිට නිලධාරියෙකු පත්කර තිබුණි. එම නිලධාරියාගේ වැටුප් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනු ලබන බවටත් රාජකාරී ආවරණය කිරීමට අදාලව දීමනා පමණක් රෝහල මගින් ගෙවීමටත් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තියට අනුව වැඩ ආවරණය කිරීමේ පත්කිරීමකට අදාලව අතිරේක පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකමක් නොමැති වුවද රෝහල විසින් මෙම නිලධාරියා වෙත 2021 ජූලි 28 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 5.66ක් සහ 2023 සැප්තැම්බර් 30 දක්වා වැඩ

ආවරණය කිරීමේ දීමනා ලෙස රු.775,170 ක් ලෙස එකතුව රු.මිලියන 6.43ක මුදලක් ආයතන සංග්‍රහයට පටහැනිව ගෙවා තිබුණි. වැඩ ආවරණය කිරීමේ දීමනාව ගෙවීම 2023 ඔක්තෝබර් මස සිට අත්හිටුවා තිබුණු අතර එම මුදල් ආපසු අයකරගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද මෙතෙක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) රෝහලේ ස්ථිර කාර්යමණ්ඩලයේ නිත්‍ය රාජකාරියක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීම හැර වෙනත් රාජකාරියක් පවරා තිබුණු බව තහවුරු කර ගැනීමට රාජකාරී ලැයිස්තුවක් ලබා දී නොතිබියදී යථෝක්ත කාලපරිච්ඡේදය වෙනුවෙන් අමතර රාජකාරී දීමනා ලෙස රු.මිලියන 4.77ක් ගෙවීම් කිරීම හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 පරිදි වෙන්කල වාහනයක් භාවිතා කිරීමට හිමිකමක් නොමැති මෙම නිලධාරී වෙත ඉන්ධන දීමනා ලෙස රු.මිලියන 1.28ක් ගෙවීම් කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(iii) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව ස්ථිර නිලධාරියෙකු පත්කරනතෙක් තාවකාලික වශයෙන් මෙම වැඩ ආවරණය කිරීමේ පත්වීම ලබාදී තිබුණද මේ වනවිට වර්ෂ 2 ½ කට අධික කාලයක් සේවයේ යොදවා තිබුණු අතර ස්ථිර පදනමින් පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සතුව වාහන 16ක් තිබුණු අතර එම වාහන සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ජාතික අයවැය චක්‍රලේඛ අංක 150 අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රෝහල වෙත ලබාදී තිබුණු වාහන 06ක් රෝහල වෙත ලැබී වසර 7 ක කාලයක් ඉක්මවා තිබුණද විගණිත දින දක්වා එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) හදිසි අනතුරකට ලක්වී තිබුණු මෝටර් රථ සම්බන්ධයෙන් මු.රෙ. 104(1) ප්‍රකාරව මූලික විමර්ශනයක් පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර අනතුර සිදුවීමෙන් වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවා අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකිරීම හේතුවෙන් රක්ෂණ ආයතනය විසින් හානි පූර්ණය කර නොතිබුණි. අළුත්වැඩියාව සඳහා පුද්ගලික සමාගමක් විසින් රු.489,200 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද, ඊට අනුව අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු නොවීමෙන් වාහනයට හානි සිදුවී තිබුණු අතර අදාල සමාගම රු.මිලියන 1.73ක නව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. අත්තිකාරම් ලෙස රු. 97,840 ක් ගෙවා තිබුණ ද නිසි කාලසීමාවන් තුළ වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශාල වියදමක් දැරීමට සිදු වී තිබුණි.

(iii) 2021 මැයි මාසයේ සිට ධාවනයෙන් ඉවත්කර තිබුණු ගිලන් රථයක් 2022 පෙබරවාරි මස අළුත්වැඩියාව සඳහා යොමුකර තිබුණු අතර එම ගිලන් රථය අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුළ රෝහල විසින් රු.මිලියන 1.2 ක් වැයකර තිබුණද වායු සමීකරණ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, පිටුපස දොර අබලන් තත්ත්වයේ පැවතීම හා රථයේ අභ්‍යන්තරය රෝගීන් ප්‍රවාහනයට සුදුසු තත්ත්වයක නොපැවතීම

හේතුවෙන් ගිලන් රථයක් ලෙස රෝහලේ කටයුතුවලට යොදවා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2016 නොවැම්බර් 03 දින රු.මිලියන 23.54ක වැටි සහිත මුදලකට පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදී ගෙන තිබුණු සායනික අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය (Incinerator) වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නඩත්තු සේවා සහ ඉන්ධන හා විදුලිය වෙනුවෙන් එකතුව රු.මිලියන 22.9ක් ගෙවා තිබුණු අතර ජලය සඳහා වැයකල මුදල වෙන්කර හඳුනාගත නොහැකි විය. මෙමගින් දෛනිකව සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ. 300 ත් 400 ත් අතර ප්‍රමාණයක් පිළිස්සීම සිදු කරන බව දක්වා තිබුණද සත්‍ය වශයෙන් පුළුස්සන ප්‍රමාණයන් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි. මෙම යන්ත්‍රය උපයෝජනය හා නඩත්තු කටයුතු පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) යන්ත්‍රය මිලදී ගැනීමේදී නඩත්තු සේවා ගිවිසුමකින් තොරව යන්ත්‍රය පමණක් මිලදීගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබියදී යන්ත්‍රයේ අවුරුදු දෙකක වගකීම් කාලය ඉකුත් වීමෙන් පසු යන්ත්‍රය මිලදීගත් ආයතනය සමඟ නඩත්තු සේවා ගිවිසුමකට එළඹී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට අවස්ථා 03කදී එකතුව රු.මිලියන 6.91ක් සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණි.

(ii) නඩත්තු සේවා සඳහා සැලකිය යුතු මුදලක් වැයකර තිබුණද යන්ත්‍රය මගින් සායනික අපද්‍රව්‍ය නිසි පරිදි පූර්ණ දහනයකට ලක් නොවන බව නිරීක්ෂණය විය.මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රය 2023 නොවැම්බර් 23 දින කල් ඉකුත්ව තිබුණද නඩත්තු සේවා ආයතනය විසින් අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් අප්‍රමාදව සිදු නොකිරීමෙන් ඊට අදාල දුම් සහතිකය ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් බලපත්‍රය අළුත් කරවාගැනීම ප්‍රමාදවී තිබුණි.

(iii) 2022/2023 වර්ෂයට අදාල කල් ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ 4.7 හා 4.8 වගන්ති ප්‍රකාරව දහනය වූ අළු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම අළු අතර අර්ධ-වශයෙන් දහනය වූ සායනික අපද්‍රව්‍ය පැවති බව නිරීක්ෂණය වූ අතර එම අළු පරිසරයට හානිදායක වන අයුරින් විවෘත පරිසරයේ ගොඩගසා තිබීමෙන් වර්ෂා කාලයේදී අවට ඇති ජල මූලාශ්‍රවලට එකතුවීමේ අවධානමක් පැවතුණි. එසේම මධ්‍යම පරිසර අධිකාරිය විසින් කරන ලද දැනුම්දීමට අනුව උපද්‍රවකාරී අපද්‍රව්‍ය (Hazardous Waste) කළමනාකරණයට අදාලව අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන ආයතනවල කුලී ආදායම පරීක්ෂා කිරීමේ දීපහත කරුණු අනාවරණය විය.

(i) රෝහල් පරිශ්‍රය තුළ කුලී පදනම මත ව්‍යාපාර කටයුතු පවත්වාගෙනයන හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව වෙතින් පිළිවෙලින් මාසිකව රු.45,000 ක් හා රු.15,000 ක් ලෙස බදු කුලී අයකරගෙන තිබුණද දෙපාර්ශවය අතර ඊට අදාලව ගිවිසුම් ඇතිකරගෙන නොතිබුණි.

(ii) 2006 වර්ෂයේදී රෝහලේ ස්ථාපනය කර තිබුණු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමඟ ඇතිකර ගෙන තිබුණු අවබෝධතා ගිවිසුමෙහි කාලානුරූපව කුලී මුදල් වැඩිකරවා ගැනීමට හා නව ගිවිසුම් ඇතිකර ගැනීමට අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර නොතිබීමෙන් 2006 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම රෝහල විසින් මාසික කුලි ලෙස රු.85,000 ක් හා 2018 වර්ෂයේ සිට රු.120,000 ක් ලෙස මාසික කුලි අයකර තිබුණි. 2023 ජුනි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් මාසික කුලිය රු.150,000 දක්වා වැඩිකිරීමටත් නව ගිවිසුමක් ඇතිකරගැනීමටත් තීරණය කර තිබුණද, කුලී මුදල් තීරණය කිරීමට අදාලව තක්සේරු වාර්තා ලබාගැනීමට හා නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(iii) ආහාර අලෙවිසැල් විසින් පරිහරණය කරනු ලබන ජලය වෙනුවෙන් ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ගාස්තුවක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) මහාරෝගාශාලා මණ්ඩලයේ පවතින රෝහල් ගාස්තු බිල්පත් හා තොග සම්බන්ධ (Systolic) පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට (Accpac) ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම හේතුවෙන් පද්ධතිය තුළ පවතින ගැණුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්හි අගයන් වෙනස්වීම මෙන්ම එකම පද්ධතිය තුළ (Systolic) වෙනස් දිනයන්හි ශේෂ වෙනස්වීම් නිරීක්ෂණය වූයෙන් එම අයිතමයන්හි නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය වන්නේද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. රෝහලේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම, පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතු වී තිබුණි.

(එ) රෝහල සඳහා බඳවාගැනීමේ පරිපාටියක් සකස් කිරීමේ කාර්යය 2023 අප්‍රේල් 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් කමිටුවක් වෙත පවරා සමාලෝචිත වර්ෂය තුළ කමිටුව වෙත රු.518,000ක මුදලක් ගෙවා තිබුණු අතර විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තනතුරු 84 කට අදාලව බඳවාගැනීමේ පරිපාටි පිළියෙල කර ඇතත් අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එසේම බඳවාගැනීමේ පරිපාටි 12 කට අදාලව වැටුප් කේතවල නොගැලපීම් හේතුවෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ඒ) 2023 දෙසැම්බර් 31 දින වනවිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 03ක් සඳහා නිලධාරීන් 266දෙනෙකු හා අනුමත කාර්යමණ්ඩලය තුළ නොවූ එක් තනතුරක් සඳහා නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ හා වර්ෂ 01 සිට වර්ෂ 05ක කාලයක් තුල ගිවිසුම් කඩකරමින් බැඳුම්කර නොගෙවා සේවය අතහැර ගොස් තිබුණු නිලධාරීන් 26 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 43.22ක බැඳුම්කර මුදල් අයකර ගැනීමේ කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණි.

(ඕ) සේවය අත්හිටවූ , සේවය අතහැර ගිය හා විදේශගත වූ සේවකයින්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 5.68ක්වූ ආපදා ණය ශේෂය මෙතෙක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම මුදලින් රු.මිලියන 5.12ක් වර්ෂ 2 සිට 7 දක්වා වූ කාල පරාසයක සිට පැවතෙන ශේෂ විය.

(ක) 1996 ජුලි 17 දිනැති අංක 96/1347/120/143 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විවිධ ශ්‍රේණි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාන්තර ශ්‍රේණි හෝ අනෙකුත් දෙපාර්තමේන්තුවල සමාන්තර තනතුරු අතර වැටුප් පරතරය සියයට 35 ක් වන අයුරින් පවත්වා ගැනීම පොදු ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර තිබුණි. මෙම වැටුප් වැඩිවීම පදනම් කරගෙන 2018 මාර්තු 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ යටතේ වෛද්‍ය, හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරී දීමනා හා අතිකාල දීමනා සඳහා 2018 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සියයට 35 වැඩිවීම චක්‍රලේඛයේ සඳහන් රේටයට එකතු කර ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව රෝහලේ වෛද්‍ය කාර්යමණ්ඩලය හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ කාර්යමණ්ඩලය වෙත චක්‍රලේඛයේ සඳහන් අතිරේක රාජකාරී හා අතිකාල දීමනාවට සියයට 35ක් එකතු කර චක්‍රලේඛය මඟින් ලබාදෙන දීමනාවට වඩා ඉහළ රේට් අගයක පිහිටුවා පිළිවෙලින් 2021, 2022 හා 2023 වර්ෂවලදී රු.මිලියන 168.43ක්, රු.මිලියන 162.47ක් හා රු.මිලියන 158.07ක් ලෙස ගෙවීම්කර තිබුණි. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ග) රෝහල් සේවයෙන් 2020 අප්‍රේල් 24 දින විශ්‍රාම ගිය පරිපාලන නිළධාරී වෙත රු.284,784ක දඩ මුදලක් ද සහිතව එකතුව රු.මිලියන 2.18ක පාරිතෝෂිකයක් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) මෙම නිලධාරියාගේ පත්කිරීම හා වැටුප් ගෙවීම සහ තනතුරු නාම අනුමත කර නොගැනීම හා මානව සම්පත් ප්‍රධානී තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් දීමනා ගෙවීම සම්බන්ධයෙන් පිළිවෙලින් 2017 හා 2020 වර්ෂයන්හිදී විගණනය විසින් අවස්ථා 02කදී විගණන විමසුම් නිකුත් කර තිබියදී මූලික විමර්ශනය සඳහා නිලධාරියෙකු පත්කර තිබුණේ නිලධාරියා විශ්‍රාමයාමට නියමිතව තිබූ දිනයට පෙර දිනදීය. මේ සම්බන්ධයෙන් විධිමත් චිනය පරීක්ෂණයක් සිදුකල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) මූලික විමර්ශනයට අනුව වැරදි ලෙස උපයාගත් වැටුප් ලෙස ගණනය කරන ලද රු.මිලියන 1.17ක මුදලක් හා විගණන විමසුම ප්‍රකාරව මානව සම්පත් ප්‍රධානී තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් වැරදි ආකාරයට ගෙවූ දීමනා ලෙස අයවිය යුතු මුදල රු.මිලියන 1.58ක් ලෙස එකතුව රු.මිලියන 2.75ක් එම නිලධාරියාගෙන් අයකරගත යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) නිළධාරියාගෙන් අයවිය යුතු මුදලට හිලව් කර ගැනීමේ අරමුණින් ඔහුගේ පාරිතෝෂික මුදල රඳවාගෙන තිබුණද අදාල නිලධාරියා විසින් කම්කරු කොමසාරිස් වෙත පැමිණිළි කිරීමෙන් පසු මහේස්ත්‍රාත් උසාවියේ නඩු පවරා තිබුණු අතර එම නඩුවට අදාල නඩු ලිපිගොණුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව අදාල නිලධාරියා වෙත රු.284,784ක දඩ මුදලක්ද සහිතව එකතුව රු.මිලියන 2.18ක

පාරිතෝෂික මුදලක් ගෙවා තිබුණි. කළමනාකරණය විසින් කඩිනම් විනය හා නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් වැරදි ලෙස ගෙවූ වැටුප්, දීමනා හා පාරිතෝෂික අධිභාර ඇතුළුව රු.මිලියන 3.04 ක් ගෙවීමට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ව) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක රෝහලේ සමස්ත කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) 2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහලේ ඇඳන් සංඛ්‍යාව සියයට 5.3 කින් හා ඇඳන් භාවිතය සියයට 10 කින් අඩු වී තිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඇඳන් සංඛ්‍යාව නොවෙනස්ව පැවති අතර, ඇඳන් භාවිතය සියයට 4 කින් වැඩි වී තිබුණි.

(ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව, සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව හා බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 17, 11 හා 30 කින් වර්ධනය වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ජයවර්ධනපුර මහරෝහලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

විගණන නිරීක්ෂණ			නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග
1.2	තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම		
	(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 48 ඡේදය ප්‍රකාරව,ප්‍රමිතිය මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් මෙන්ම ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද, සමාලෝචිත වර්ෂය රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල රු.මිලියන 1.71ක බැර ශේෂ රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල හර ශේෂ වලින්ද, වෙළඳ ණයහිමියෝ හර ශේෂ රු.මිලියන 2.2ක් වෙළඳ ණයහිමි බැර ශේෂවලින්ද හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. පෙර වර්ෂ වලදීද මේ පිළිබඳ කරුණු හෙළිදරව් කර තිබුණද අවශ්‍ය නිවැරදි කිරීම් කර නොතිබුණි.	2023 වර්ෂයේදී ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධව සිදු කරන ලද නිවැරදි කිරීම් සඳහා මෙම හර ශේෂ හා බැර ශේෂ හිලව් කිරීම කරන ලදී. මෙම හිලව් කිරීම් සිදු කරන ලද්දේ ණයගැති ණයහිමි ශේෂ වල පැවති වැරදි නිවැරදි කිරීම සඳහා පමණි. තවදුරටත් සොයා බලා 2024 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.
	(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.මිලියන 205.26ක ශේෂයක් ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌණතාවයට ගලපා තිබුණි.	2024 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී සඳහන් කර ඇති ක්‍රමවේදයට අනුව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 4,347.17ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙය ප්‍රමුඛතාවය දිය යුතු කරුණක් ලෙස හඳුනාගෙන ඇති අතර මෙතෙක් ප්‍රමාද වී තිබූ වෛද්‍ය උපකරණ සමාලෝචනය කිරීම හා ප්‍රත්‍යාගණනය කිරීම දැනට සිදු කරමින් පවතී. මෙහිදී ගැටලුවක්ව පැවතියේ ජීව වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් වන අතර එම අයිතම මේ වන විට ලැයිස්තුගත කර තක්සේරු කිරීම ආරම්භ කර ඇත.

	(ඇ)	රෝහල් සතු ඉඩමේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10.0229ක් වුවද ඉන් හෙක්ටයාර් 9.8047ක් පමණක් 2022 වර්ෂයේදී රු.මිලියන 4,845.5කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර හෙක්ටයාර් 0.2182ක භූමි ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	මෙම රෝහලට අයත් ඉඩම දීර්ඝ සොයා බැලීමකින් අනතුරුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් බව පෙනී ගිය හෙයින් සම්පූර්ණ පවරා ගැනීම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. එය නිම වූ පසුව මුළු ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරමි.
	(ඉ)	සමාලෝචිත වර්ෂයේ රෝහල් බිල්පත්වල වැරදි නිවැරදි කිරීම සඳහා යොදන ලද එකතුව රු.මිලියන 4.95ක් හා රු.මිලියන 31.12ක් වූ පිළිවෙලින් හරපත් හා බැරපත්වල හා අගයන් අදාල ආදායම් ගිණුම්වලට ගැලපීම් කිරීම වෙනුවට රු.මිලියන 26.17ක් වූ එම ශේෂයන්හි වෙනස ආදායම් ගැලපුම් (Income Adjustment) ලෙස විවිධ වියදම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරිපත් කිරීමේ දෝෂයකි. ඉදිරියේ දී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	(ඊ)	සමාලෝචිත වර්ෂයේදී බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 19 දෙනෙකුගෙන් ලැබිය යුතු බැඳුම්කර ආදායම රු.මිලියන 33.22ක් වුවද රු.මිලියන 37.33ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු බැඳුම්කර ආදායම් (ජංගම වත්කම්) හා වර්ෂයේ ලාභය රු.මිලියන 4.11ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු ගෙවූ වැටුප්වල එකතු අගය රු.මිලියන 31.03ක් පෙර වර්ෂ ගැලපීමක් ලෙස සලකා වැරදි ආකාරයට බැඳුම්කර ආදායම් ගිණුමට හර කර සමුච්චිත ලාභාලාභ ගිණුමට බැරකර තිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයේ බැඳුම්කර ආදායම හා ලාභය එම වටිනාකමෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	එකඟවෙමි. 2024 වර්ෂයේ දී ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. 2023 වර්ෂයේ හෙද නිලධාරීන් 19 දෙනෙකුගේ වැටුප් හා බැඳුම්කර ලෙස රු. 37,331,043 ක වටිනාකමක් බැඳුම්කර ගිණුම බැරකර,ලැබිය යුතු බැඳුම්කර ගිණුම හර කරන ලදි. පසුව එම මුදල තුළ අඩංගු වැටුප් වටිනාකම බැඳුම්කර ගිණුම හර කර සමුච්චිත ලාභාලාභ ගිණුම බැර කරන ලදි. පසුගිය වර්ෂවලට අදාල වැටුප් වියදම ප්‍රවර්ථන වර්ෂයේ ආදායමෙන් අඩු කිරීම සඳහා මෙම ගැලපීම් සිදු කරන ලදි.
	(උ)	සමාලෝචිත වර්ෂය තුළ බැඳුම්කර කඩකල හෙද නිලධාරීන් 15දෙනෙකුගෙන් අයකර ගන්නා ලද රු.මිලියන 15.80ක මුදල වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීමකින් තොරව පෙර වර්ෂ ගැලපීමක් ලෙස සලකා සමුච්චිත ලාභාලාභ ගිණුමට බැරකර තිබුණි. ඒ අනුව වර්ෂයේ බැඳුම්කර ආදායම හා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	අදාල හෙද නිලධාරීන් 15 දෙනෙකුගේ මුදලින් ලැබූ වැටුප් හා බැඳුම්කර වටිනාකම බැඳුම්කර ගිණුම බැර කර, ලැබීම් මුදල් පොත හර කරන ලදි. පසුව එම නිලධාරීන් 15 දෙනාට අදාල ගෙවූ වැටුප් ප්‍රමාණය බැඳුම්කර ආදායම් ගිණුමෙන් සමුච්චිත ලාභාලාභ ගිණුමට ගැලපුම් කරන ලදි.

	(උ)	සමාලෝචිත වර්ෂය තුළ වෘත්තීය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීමේ නිශ්චිත හා නිසි ක්‍රමවේදයක් මහාරෝගාශාලා මණ්ඩලය විසින් හඳුනාගෙන නොතිබුණු අතර වෘත්තීය ගාස්තු ආදායම වූ රු.මිලියන 653.93ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර, සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ගෙවා නිබුණු වෘත්තීය ගාස්තු රු.මිලියන 623.94ක් එම ගිණුමට හර කර තිබුණි. 2023 දෙසැම්බර් මාසයට අදාලව ණයලිපි (Credit Letter) මත රෝහලින් බැහැරව යන රෝගීන්ගේ රෝහල් ගාස්තු හා වෘත්තීය ගාස්තු ලෙස රෝහල් ගාස්තු ආදායම් ගිණුමෙන් රු.මිලියන 62.84ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර තිබුණි. ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමේ 1998 වර්ෂයේ සිට පවතින රු.මිලියන 3.62 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එම ගිණුමේ තවදුරටත් රු.මිලියන 27.72ක ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ශේෂයක් වුවද එම ශේෂය නහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	වෘත්තීය ගාස්තු 2022 වර්ෂයේ ඔක්තෝබර් මස සිට රෝහල් බිල්පතට ඇතුලත් කර ඇති අතර වෘත්තීය ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට ඒ අනුව හැකි විය. 2023 වර්ෂය තුල රු.663,017,022 ක මුදලක් වෘත්තීය ගාස්තු ලෙස බිල්පත් වලට ඇතුලත් කර අයකර ගන්නා ලදි. වෘත්තීය ගාස්තු ලෙස රු. 572,456,424 ක මුදලක් වර්ෂය තුල ගෙවා ඇත. ඔබ විසින් සඳහන් කර ඇති රු.62,839,039 ක මුදල එලෙස බිල්පත් වලට ඇතුලත් වී ඇති දෙසැම්බර් මසට අදාල වෘත්තීය ගාස්තු ප්‍රමාණය මිස නිශ්චිතව හඳුනා ගැනිමකින් තොරව මාරු කර ඇති වෘත්තීය වටිනාකමක් නොවන බවද සඳහන් කරමි. 1998 වර්ෂයේ සිට පවතින රු 3,616,142 ක මුදල ඉදිරියේදී ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. 2023 වර්ෂයේ අවසානයට ගෙවීමට ඇති වෘත්තීය ගාස්තු මුදල රු. 94,176,740 කි. මෙම වෘත්තීය ගාස්තු වටිනාකමට අදාල විස්තර ලබා දීමට කටයුතු කරමි.
	(ඒ)	පෙර වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත් වූ ඖෂධ වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 9.89ක් හා රු.මිලියන 24.14ක් ලෙස එකතුව රු.මිලියන 34.03ක වෙන්කිරීමක් සිදුකර නිබුණද, කල් ඉකුත් වූ ඖෂධවලට අදාල වෙන්කිරීම් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් රෝහල විසින් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.	කල් ඉකුත් වූ ඖෂධ සඳහා වෙන් කිරීමේ ක්‍රමවේදයක් මූල්‍ය ප්‍රකාශණවල හෙලිදරව් කිරීමට කටයුතු කරමි. මේ සම්බන්ධව ක්‍රමවේදයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් . කිරීමට කටයුතු කරමි.
	(ඔ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල එකතුව රු.මිලියන 39.89ක් වූ විදුලිය හා ජල බිල්පත් වටිනාකම උපචිත වියදම් ලෙස ගැලපීම් නොකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමෙන් වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි.	අදාල නිවැරදි කිරීම් 2024 වර්ෂයේ ජනවාරි මස ජනල් සටහන් අංක 11 මගින් සිදුකර ඇත.
	(ඕ)	දහන යන්ත්‍රයේ (Incinerator) සේවා ගිවිසුම ප්‍රකාරව 2023 ඔක්තෝබර් 01 දින සිට 2024 සැප්තැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ගෙවන ලද සේවා මුදලින් 2024 වර්ෂයට අදාල රු.මිලියන 2.17ක මුදල ඉදිරියට ගෙවීම් ලෙස හඳුනාගැනීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.

	(ක)	2023 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, රෝහල් ගාස්තු ණයගැතියෝ හා ව්‍යාධිවේදී රසායනාගාර අත්තිකාරම් යන විෂයයන් 03කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් හා විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු හා ලේඛන අනුව වටිනාකම අතර රු.මිලියන 56.77 වෙනසක්වූ අතර එම වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.	ණයහිමියෝ මෙම වෙනස්කම්වලට අදාල හේතු සොයා බැලීම මේ දිනවල කරමින් පවති. ඉදිරියේදි සොයා ගන්නා ලද වෙනස්කම් වලට අදාල ගැලපුම් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. රෝහල් ගාස්තු ණය ගැතියෝ මෙම වෙනස්කම්වලට අදාල හේතු සොයා බැලීම මේ දිනවල කරමින් පවති. ඉදිරියේදි සොයා ගන්නා ලද වෙනස්කම් වලට අදාල ගැලපුම් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. ව්‍යාධිවේදී රසායනාගාර අත්තිකාරම් 2023 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා ශේෂ පිරික්සුම් ලබා ගත් පසුව Accpacc පද්ධතිය Lock කිරීමට පෙර ගබඩා භාරකරුවන් විසින් මෙම භාණ්ඩ ලැබීම් පත්‍ර (GRN) පද්ධතිය තුලට ඇතුලත් කර ඇත. මේ පිළිබඳ විස්තර විගණන අංශය වෙත ලබා දී ඇත. ඉදිරියේ දී මෙවැනි වැරදීම් සිදු නොවීමට අදාල නිලධාරින්ට උපදෙස් දෙමි.
	(ග)	2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,899.55ක් වූ ණයහිමියෝ,රෝහල් ගාස්තු ණය ගැතියෝ හා සේවා ගාස්තු යන ගිණුම් විෂයයන් 03ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් සහ උපයෝගී ලේඛන ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීම හෝ සන්නිරීක්ෂණය කිරීම හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.	සේවා ගාස්තු මෙම සේවා ගාස්තුව අයකරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත වන අතර එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සොයා ගැනීම අපහසු වී ඇත. වෘත්තීය ගාස්තු වලින් 0.15% ක් පමණක් රෝහල් සේවා ගාස්තු ලෙස අයකර ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධව දීර්ඝව සාකච්ඡා කළ අතර එම ගාස්තු එම අගයේම තැබීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. ණයහිමියෝ,රෝහල් ගාස්තු ණයගැතියෝ Accpac ගිණුම්කරණ පද්ධතියට අනුව ලබා ගත හැකි ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණය විගණනය සඳහා ලබා දෙන ලදි. මෙම පද්ධතියට අදාල Source code අප සතුව නොමැති බැවින් සම්මත ආකෘති (standard format) වෙනස් කල නොහැකි වී ඇත.
	(ව)	නොග සම්බන්ධ පරිගණක (Systolic) පද්ධතියේ සිදුවන භාණ්ඩ ලැබීමේ පත්‍ර (GRN) ඉවත් කිරීම් ගිණුම්කරණ පරිගණක පද්ධතිය (Accpac) තුළ යාවත්කාලීන නොවීම, ගිණුම්කරණ පරිගණක පද්ධතියේ	Accpac ගිණුම් පද්ධතිය තුල යම් කිසි නිවැරදි කිරීමක් සිදු කිරීමේදී එම ක්‍රියාවලිය සිදු කල හැක්කේ හර පත් (Debit Note) හා බැර පත් (Credit Note) මගින් පමණකි. ණයහිමි හා ණයගැති ශේෂ

		භාණ්ඩ ලැබීමේ පත්‍ර දෙවරක් සටහන් වීම සහ අගයන් වෙනස් වී සටහන්ව තිබීම, ගිණුම්කරණ පරිගණක පද්ධතියෙන් මුදල් ගෙවීම සිදු වුවත් එම ගෙවීම් කේවල ණයහිමි ශේෂ වලට ගලපා නොතිබීම,කේවල ණයහිමි ශේෂ තුළ දඩ මුදල්, ප්‍රමාද ගාස්තු ගැලපුම් සිදුකර නොතිබීම හා කේවල ණයගැති ශේෂ වලට අදාලව මුදල් ලැබීම් නිසි පරිදි ගැලපීම් නොකිරීම යනාදී හේතු මත වෙළඳ ණයහිමි හා වෙළඳ ණයගැති ශේෂවල සිදුවී ඇති වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් වවුචර් පිළියෙල කිරීමකින් තොරව හරපත් හා බැරපත් මගින් 2023දෙසැම්බර් 31 දිනට ශුද්ධ ශේෂය රු.මිලියන 22.73ක් සමුච්චිත ලාභලාභ ගිණුමට ගැලපීම් කර තිබුණි.	නිරවුල් කිරීම සඳහා ජනල් වවුචර් පිළියෙල කිරීමෙන් කල නොහැකිය.
	(ජ)	ණයගැති ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව බොල් ණය සඳහා පිළිගත් ක්‍රමවේදයට අනුව සියයට 5ක් වෙන් කිරීම් කළ යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස රු.මිලියන 6.3ක් වැඩියෙන් බොල් ණය වෙන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.	2024 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.
	(ට)	වැඩ ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව ගෙවන ලද වැඩ පූර්ව අත්තිකාරම් රු.මිලියන 7.11ක් අත්තිකාරම් ලෙස නොදක්වා මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා තිබුණි.	මෙම මුදල ප්‍රධාන ලෙජරයේ වැඩ පූර්ව අත්තිකාරම් ලෙස වෙනම ගිණුමක පවතින අතර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා ඇත. මෙය ඉදිරිපත් කිරීමේ දෝෂයකි (Presentation error). 2024 වර්ෂයේ ගිණුම්වල නිවැරදිව පෙන්නුම් කිරීමට කටයුතු කරමි.
	(ඩ)	සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද එකතුව රු.මිලියන 3.12ක් වූ වෛද්‍ය උපකරණ, ලී බඩු හා සවිකිරීම් අගය පරිත්‍යාග ගිණුමට බැර කිරීම වෙනුවට ණයහිමි ශේෂයක් ලෙස දැක්වීම හේතුවෙන් පරිත්‍යාග එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි.
	ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.		
1.3	**මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**		
	මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන්		

	අදහස්වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි. මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.	
1.4	**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**	
	මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ	

	කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.	
1.5	**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**	
	සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදි. මාවිසින් තව දුරටත්, •ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුයෙන් සිදුවන ප්‍රණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි. •අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි. •භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තු වල	

	සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී. •සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය. •මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී. මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.	
2.	**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**		
	2.1	2018 අංක19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.	
	2.1.1	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නිබුණි.	
	2.1.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) ඈ (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.	

	2.1.3	මෙම වාර්තාවේ 1.2(අ), (ඇ) හා (ඈ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.	
	2.2	අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.	
	2.2.1	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.	
	2.2.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.	
	නීති රීති හා විධිවිධානවලට යොමුව		
	(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
	i.	II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති කාර්ය මණ්ඩලයේ සෑම සේවයක හා ශ්‍රේණියක නනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, නනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත් කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, මේ දක්වාම බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ අමාත්‍ය මණ්ඩල අනුමත වැටුප් ප්‍රතිපත්තිය වනුයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැටුපට 35% එකතු කර ගෙවීමයි. මෙම රෝහලේ තනතුරු නාම 74ක් ඇති අතර ඒවායින් 13ක් හැර අනෙක් සියළුම තනතුරු වලට අනුරූපී තනතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතී. බඳවා ගැනීමේ පටිපාටි අනුමත කිරීමට යාමේදී මෙම තනතුරු නාම සහ වැටුප් කේතවල වෙනස්කම් ඇති බව නිරීක්ෂණය වූ බැවින් එම වැටුප් කේතයන් නිවැරදි කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. එම අනුමැතියට යටත්ව බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමට පත් කල කමිටුව විසින් මේ වන විටත් බඳවා ගැනීමේ පටිපාටි කෙටුම්පත් සකසා ඇත. එම කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා

			කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා අනුමත කර ගෙන ඉදිරි කටයුතු කරනු ඇත. සියළුම කෙටුම්පත් මේ වන විට සකස් කර අවසන් වී ඇත.
	(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	i.	<u>මුදල් රෙගුලාසි 103 සහ 104 වගන්ති</u> වාහන අනතුරු හේතුවෙන් සිදුවන අලාභ සම්බන්ධයෙන් ඊට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ පැවැත්විය යුතු වුවද රෝහලේ වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහන අනතුරු සම්බන්ධයෙන් ඊට අදාල වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා මේ වන විට පරීක්ෂණ පවත්වමින් ඇතත් අතපසු වීමකින් අදාල ලිපි ගොනු විගණනය කරන අවස්ථාවේදී විගණනයට ඉදිරිපත් කර නොමැත.
	ii.	<u>මුදල් රෙගුලාසි 110</u> සෑම ආයතනයක් විසින්ම සිදුවන හානි වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ආකෘතිය ප්‍රකාරව හානි ලේඛනයක් පවත්වා ගත යුතු වුවද රෝහලේ වාහන සම්බන්ධයෙන් නිසි ආකෘතිය පරිදි සකස් කල හානි ලේඛනයක් පවත්වා නොතිබුණි.	මු.රෙ. 110 ප්‍රකාරව හානි ලේඛනයක් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා පරිපාලන නිලධාරී වෙත දැනුම් දුන් අතර ඒ අනුව හානි ලේඛනය ආරම්භ කිරීමට කටයුතු කරමින් පවති.
	iii.	<u>මුදල් රෙගුලාසි 1642</u> ආයතනයේ වාහන භාවිතා කරනු ලබන නිළධාරීන් විසින් හෝ ඔවුන් නොමැති අවස්ථාවන්හිදී ඒ වාහනවල රියදුරන් විසින් සිදුවන සියළුම හදිසි අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඇතැම් වාහන අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර ඇතත් අතපසු වීමකින් විගණනය කරන අවස්ථාවේදී අදාල ලිපි ගොනු විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. මේ වන විට සියළුම වාහන අනතුරු සම්බන්ධව පොලිසියට වාර්තා කිරීම සිදුවේ.
	(ඇ)	<u>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය</u> ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමේ කටයුතු මේවන විට සිදු කරමින් පවති. ජීව වෛද්‍ය උපකරණ ප්‍රත්‍යාගණන කටයුතු සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ සහාය ඇතිව, වෛද්‍ය පරිපාලනය පිළිබඳ පුහුණු වන වෛද්‍යවරුන්ගේද අධීක්ෂණය යටතේ ගිණුම් අංශය මගින් කරගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍රය විගණන කමිටුවේ දී අනුමත කර ගන්නා ලදී.
	(ඈ)	<u>2016 ඔක්තෝබර් 10 දිනැති අංක DMS/1758-Vol.1 දරන කළමනාකරණ සේවා</u> දෙපාර්තමේන්තු චක්‍රලේඛය. අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතුකර නොතිබුණි.	මෙම ක්‍රියාවලිය කොටස් 2කි. 1.මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණය වන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල වැටුප් පරිමාණයට 35% ක් එකතු කර වැටුප් ගෙවීමයි. සෘජුව එසේ කල හැකි වැටුප් පරිමාණ 61කි. 2.මීට අමතරව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නොපවතින වැටුප් පරිමාණ 13කි.

			ඉහත සඳහන් අංක 1හී සඳහන් කල වැටුප් පරිමාණ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමත කර කළමනාකරණ දෙපාර්තමේන්තුවට යැවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඉතිරි වැටුප් පරිමාණ 13 සඳහා සම්පූර්ණ බඳවා ගැනීමේ පටිපාටියම එවන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) විසින් අප වෙත දැනුම් දී ඇත. එම කෙටුම්පත් 13 සකසා අවසන්වී ඇති අතර එයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුනු වහාම, නිර්දේශ කර කළමනාකරණ දෙපාර්තමේන්තුවට යැවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යවනු ලැබේ. ඉහත 1හි සඳහන් කල වැටුප් කේතයන් සහ දෙවනුව සඳහන් කල බඳවා ගැනීමේ පටිපාටි ලැබුණු පසු ඒවා අධ්‍යයනය කර ඔවුන්ගේ අනුමැතිය ලබා දීම සිදු කරන බව කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් මේ පිළිබඳව කල සාකඡාවේදී අප වෙත දැනුම් දෙන ලදි. එබැවින් ආසන්න වශයෙන් අවුරුදු 40ක් පමණ නොවිසඳී තිබූ මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමි.
	2.2.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	ජාතික විගණන පනතේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් අදාල නිලධරයන් දැනුවත් කරමින් පනතට අනුව රෝහලේ සියලු කටයුතු, බලතල,කර්තව්ය සහ කාර්යයන්ට අනුකූල වන ලෙස උපරිම අයුරින් සිදු කිරීමටත්, අඩුපාඩු හඳුනාගනිමින් ඒවා නිවැරදි කර ගැනීමටත් කටයුතු කරන බව සඳහන් කරමි.
	2.2.4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.	රෝහල් සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවක් තුල සහ අදාල නීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කරමි.

	2.3	**වෙනත් කරුණු**	
	(අ)	රෝහල විසින් 2022 ඔක්තෝබර් සිට ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා එකතු කල අගය මත බදු ලෙස සියයට 15 ක බදු ප්‍රතිශතයක් රෝගීන්ගේ බිල්පත්වලින් අයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	2022 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතු කල අගය මත බදු ලෙස අයකල රු.මිලියන 21.21ක් සම්බන්ධයෙන් 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 3 පරිච්ඡේදයේ 21 වගන්තිය පරිදි කාර්තුමය වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාල කාර්තුමය වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි.
	ii.	රෝහලේ ගෙවන වාට්ටුවල කාමර ගාස්තු සඳහා පමණක් එකතු කල අගය මත බදු අයකර තිබුණද පනතේ විධිවිධානවලට අනුව එම ආදායමෙන් ඊට අදාලව ගෙවන ලද එකතු කල අගය මත බදු පමණක් හිලව් කර ගැනීමෙන් තොරව අයකල සම්පූර්ණ බදු මුදලම ගෙවූ බදුවලට හිලව් කරගෙන තිබුණි.	රෝහලේ කාමර ගාස්තු මත පමණක් එකතු කල අගය මත (VAT) බදු අය කරනු ලැබුවත් එම කාමර වලට අදාල වියදම් වෙනම හඳුනා ගැනීම ඉතාමත් දුෂ්කර කාර්යක් වූ බැවින් අය කල සම්පූර්ණ බදු මුදල් ගෙවූ මුදල් වලට හිලව් කිරීමට කටයුතු කරන ලදී.
	iii.	2016, 2017 හා 2018 වර්ෂයන්හිදී යටෝක්ත පනතේ 26 වගන්තියට අනුකූල නොවීම හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණු එකතුව රු.මිලියන 5.2 ක දඩ මුදල සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණද එම දඩ මුදල නිදහස් කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	මේ පිළිබඳව සොයා බලා හැකි ඉක්මනින් විගණන අංශය දැනුවත් කිරීමට කටයුතු කරමි.
	(ආ)	රෝගීන්ගේ රෝහල් බිල්පත් සඳහා මුදල් අයවීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.	
	i.	නිශ්චිත පදනමකින් තොරව ඉහළ කළමණාකාරීත්වයේ අනුමැතීන් මත ඇතැම් රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ගෙවීම්වලින් නිදහස් කර තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතුව රු.මිලියන 28.82ක බිල්පත් නිදහස් කර තිබුණු අතර 2017 වර්ෂයේදී බැරපත් මගින් මෙම ගිණුම්වලින් එකතුව රු.මිලියන 6.4ක බිල්පත් ඉවත්කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	•යම් කිසි රෝගියෙකු හදිසියේ රෝහලට රැගෙන ආ විට එම රෝගියාගේ මුදල් ගෙවීමේ හැකියාව නොතකා රෝගියාගේ ජීවිත ආරක්ෂාව සඳහා හදිසි ප්‍රතිකාර සිදු කරන අතර එම රෝගියාට මුදල් ගෙවීමේ හැකියාව නොමැති නම් ඒ සඳහා අදාල වන ගාස්තු නිදහස් කිරීමටත්, •මොළය මිය ගිය රෝගියෙකුගේ අවයව ලබා ගන්නා තුරු දැරීමට සිදුවන ගාස්තු නිදහස් කිරීම සඳහාත්, •අක්මාව බද්ධ කිරීම කරනු ලබන මුල් රෝගීන් කීපදෙනෙකු සඳහා අදාල වන ගාස්තු නිදහස් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩල

			තීරණ ගෙන ඇත. එසේම විගණන වාර්තාවෙහි සඳහන් වන අකාරයේ සියලු බිල්පත් නිදහස් කිරීම් මේ වනවිට නැවැත්වීමට කටයුතු කර ඇත. එම නිදහස් කර ඇති ගාස්තු පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙසට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ෂණ අංශය වෙත යොමු කර ඇති අතර එම පරීක්ෂණයේ වාර්තාව ලැබූ පසුව පොත්වලින් ඉවත් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	ii.	රෝහල් ගාස්තු බිල්පත් නොගෙවා රෝහලෙන් බැහැරවූ රෝගීන්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 23.07ක ණයගැති ශේෂයක් පැවති අතර මෙම බිල්පත්වල වටිනාකම රු.360 සිට රු.මිලියන 2.04 දක්වා වූ පරාසයක විය. රෝගීන් රෝහලෙන් බැහැරව යාමේදී රෝහල් ගාස්තු අයකර නොනිබීමට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.	දැනට රෝහලට රෝගියෙකු ඇතුළු වූ පසු අදාල රෝගියා මුදල් ගෙවා යන බවට රෝගියා හෝ රෝගියා කැටුව එන පුද්ගලයකු පත්‍රිකාවක අත්සන් කරනු ලබයි. ඒ අනුව රෝගියකු මුදල් ගෙවීමට බැඳී පවතී. මුල් කාලයේදී එසේ නීතිමය ලියවිල්ලකට රෝගියාගේ පාර්ශවයේ අත්සන් ගෙන නොතිබූ අතර 2020 වර්ෂයේ පමණ සිට ඉහත සඳහන් කල පරිදි ලියවිල්ලකට අත්සන් ගැනීම සිදු කරනු ලැබේ. ඒ අනුව රෝහල් ගාස්තු නොගෙවා යන රෝගීන් සම්බන්ධව නීතිමය කටයුතු කිරීමට රෝහල් පොලිසියට දැන්වීම සිදු කරනු ලැබේ. එසේ වුවද රෝහල් පොලිසියද නීතිමය කටයුතු කර නොමැති අවස්ථා පැවති අතර ඒ සඳහා මිරිහාන පොලිස් පරීක්ෂක වෙතද දන්වා සිහිකැඳවීම්ද යොමු කර ඇත.
	iii.	නොග හා බිල්පත් පිළිබඳ (Systolic) පරිගණක පද්ධතියේ නොරතුරුවලට අනුව ප්‍රතිකාර ගෙන රෝහලින් බැහැරව ගිය එහෙත් බිල්පත් පියවා නොතිබුණු රෝගීන් 22 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 2.05ක රෝහල් ගාස්තු බිල්පත් පැවති අතර බිල්පත් නොගෙවා රෝගීන් රෝහලින් බැහැරවී තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.	දැනට රෝහලට රෝගියෙකු ඇතුළු වූ පසු අදාල රෝගියා මුදල් ගෙවා යන බවට රෝගියා හෝ රෝගියා කැටුව එන පුද්ගලයකු පත්‍රිකාවක අත්සන් කරනු ලබයි. ඒ අනුව රෝගියකු මුදල් ගෙවීමට බැඳී පවතී. මුල් කාලයේදී එසේ නීතිමය ලියවිල්ලකට රෝගියාගේ පාර්ශවයේ අත්සන් ගෙන නොතිබූ අතර 2020 වර්ෂයේ පමණ සිට ඉහත සඳහන් කල පරිදි ලියවිල්ලකට අත්සන් ගැනීම සිදු කරනු ලැබේ. ඒ අනුව රෝහල් ගාස්තු නොගෙවා යන රෝගීන් සම්බන්ධව නීතිමය කටයුතු කිරීමට රෝහල් පොලිසියට දැන්වීම සිදු කරනු ලැබේ. එසේ වුවද රෝහල් පොලිසියද නීතිමය කටයුතු කර නොමැති අවස්ථා පැවති අතර ඒ සඳහා මිරිහාන පොලිස් පරීක්ෂක වෙතද දන්වා සිහිකැඳවීම්ද යොමු කර ඇත.

	iv.	රෝහලින් බැහැරව ගිය එහෙත් අවසාන බිල්පතක් සකස්කර නොතිබුණු රෝගීන් 08 දෙනෙකුට පරිගණක පද්ධතිය තුළ දෛනිකව බිල් සැකසෙමින් පැවති අතර 2024 මැයි 03 දින වන විට එම බිල්පත්වල එකතු අගය රු.මිලියන 35.72ක් විය. මෙම රෝගීන් හඳුනාගෙන රෝගී සත්කාර වෙනුවෙන් අයවිය යුතු රෝහල් ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ පිළිබඳව සොයා බලා පරිගණක පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කරමි.
	v.	ණය ලිපි (Credit Letters) ඉදිරිපත් කර රෝහලින් බැහැරව ගිය රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අදාල රක්ෂණ ආයතන හෝ සේවා ආයතන වෙතින් ප්‍රතිපූර්ණය නොවීමෙන් ආයතන 09කින් අයවිය යුතු රු. මිලියනය ඉක්මවූ දින 90කට වැඩි කාලයක සිට පැවතෙන එකතුව රු.මිලියන 29.62ක ණයගැති ශේෂයක් පැවතුණි.	සමහර රක්ෂණ ආයතන වලින් රෝහල් ගාස්තු ලැබීම ප්‍රමාද වන බව පිලිගන්නා අතර මේ පිළිබඳව ඉක්මනින් පියවර ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙමි. 2021 වර්ෂයෙන් පසුව ඇති වූ වාතාවරණයත් සමඟ සමහර බිල් පත් එම ආයතන වලට නොලැබී ඇති බවද දැන ගන්නට ඇත. මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරමි.
	(ඇ)	2021, 2022 හා 2023 වර්ෂ තුළ වෘත්තිය ගාස්තු ලෙස ගෙවන වාට්ටුවලට අදාලව වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත ගෙවූ මුදල හා එම වාට්ටුවලින් රෝහල වෙත ලැබුණු ආදායම පිළිවෙලින් රු. මිලියන 648.3 ක්, 857.5 ක් හා 1,111.6 වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිභාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි අයකරන ගාස්තු තීරණය කර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව බිල්පත් වටිනාකමෙන් සියයට 24 සිට සියයට 89 දක්වා වූ පරාසයක වෘත්තීය ගාස්තු අයකර තිබුණි.	අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෘත්තීය ගාස්තු නියාමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇත. ඉදිරියේදී එම කමිටු වාර්තාව අනුව කටයුතු කරමි.
	ii.	වෛද්‍ය නිලධාරීන් විසින් නිවාඩු දින දීමනා ලබා ගත් කාලසීමාව තුළ පෞද්ගලික සේවයේ යෙදී වෘත්තිය දීමනාද අයකර තිබුණු අතර නියැදි විගණන පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ වෛද්‍ය නිලධාරීන් 07 දෙනෙකු විසින් එසේ වෘත්තිය දීමනා ලෙස අයකර තිබුණු මුදල රු.මිලියන 1.52ක් විය.	එවැනි වැරදි යළි ඇති නොවන ආකාරයෙන් ශල්‍යාගාරය, පාලන අංශය හා ගිණුම් අංශය අතර සෘජු සම්බන්ධීකරණ ක්‍රමවේදයක් අනුගමනය කරමින් ගෙවීමට පෙර විධිමත් පරීක්ෂාවකට ලක් කිරීමට කටයුතු කර ඇත.
	iii.	1984 ජූලි 18 දිනැති අංක අමප/1984/335(2) දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2000 නොවැම්බර් 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී වේලාව	ශල්‍යාගාරය සහ ගිණුම් අංශය අතර සෘජු සම්බන්ධීකරණ ක්‍රමවේදයක් සකස් කොට මෙම කටයුතු නියාමනය කිරීම ආරම්භ කොට ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම

		තුළ ගෙවන වාට්ටුවල රෝගීන් සඳහා සිදුකරන ශල්‍යකර්ම වෙනුවෙන් වෘත්තීය ගාස්තු අය කළ නොහැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව එසේ වෘත්තීය ගාස්තු ලෙස අය කර තිබුණු මුදල රු.මිලියන 4.91ක් විය.	ක්‍රියාවලිය විධිමත් ආකාරයට සිදුවනු ඇත.
	iv.	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා 2023 වර්ෂයේදී වෘත්තීය ගාස්තු ලෙස රු.මිලියන 60.73ක් ගෙවා තිබුණි.	වෘත්තීය ගාස්තු නියාමනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇත. ඉදිරියේදී එම කමිටු වාර්තාව අනුව කටයුතු කරමි.
	v.	රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා වෘත්තීය ගාස්තු අයකිරීමට නිසි අනුමැතියකින් තොරව හා විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රෝහල් කාර්ය මණ්ඩලය තුළ නොවන බාහිර වෛද්‍යවරුන් 08 දෙනෙකු රෝහලේ සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදු කර වෘත්තීය ගාස්තු ලෙස එකතුව රු.මිලියන 11.98ක් රෝගීන්ගෙන් අය කර තිබුණු අතර ඉන් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් ගෙවා තිබුණි.	වෘත්තීය ගාස්තු මඟින් අදාල සේවා ගාස්තුව (0.15) කළමනාකරණ වියදමක් ලෙස අයකර ගත්තද, මේ සඳහා වැයවෙන අනෙකුත් වියදම් රෝගියාගෙන් අයකර ගන්නා අතර එයට සියයට 30 ලාභාන්තිකයක් ද රෝහල අයකර ගනී. බාහිරව පැමිණෙන විශේෂඥ වෛද්‍යවරුන්ට අදාලවන රෝගීන්ගේ වගකීම ගැනීම සඳහා රෝහලේ තුල සිටින විශේෂඥ වෛද්‍යවරයෙක් සිටිය යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගෙන ඇති අතර එයට අනුව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. බාහිර විශේෂඥ වෛද්‍යවරුන්ට රෝහල තුලට රෝගීන් ඇතුලත් කල හැක්කේ රෝහලේ ස්ථිර විශේෂඥ වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ පමණි. මේ පිළිබඳ විස්තර විගණන අංශයට ලබා දීමට කටයුතු කරමි.
	vi.	2023 වර්ෂය තුළදී කාර්යමණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 601.74කින් මණ්ඩලයේ ආදායමට බැරකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.945,345ක් පමණක් විය. 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවත්නා වෘත්තීය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් විගණනයට ඉදිරිපත් නොවුණු අතර කාලානුරූපීව අවශ්‍ය සංශෝධනයන් සිදුකිරීමට රෝහල් පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි.	මෙම සේවා ගාස්තුව අයකරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත වන අතර එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සොයා ගැනීම අපහසු වී ඇත. වෘත්තීය ගාස්තු වලින් 0.15% ක් පමණක් රෝහල් සේවා ගාස්තු ලෙස අයකර ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධව දීර්ඝව සාකච්ඡා කළ අතර එම ගාස්තු එම අගයේම තැබීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.
	vii.	රෝහල විසින් වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා ගෙවනු ලබන වෘත්තීය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අඩු කිරීමකින් තොරව 2023 ජුනි 08 දිනැති	මෙම කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව වෘත්තීය ගාස්තු මත උපයන විට බදු අය කිරීම ක්‍රමවත් කිරීමට කටයුතු කරමි.

		අංක S.B.M 1.4 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2022 දෙසැම්බර් 22 දිනැති අංක. SEC/2022/E/03 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛය පදනම් කර ගෙන රු. 100,000 කට වැඩි වෘත්තිය ගාස්තු ගෙවීම් මත 2023 ජනවාරි මාසයේ සිට සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් පමණක් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර තිබුණි. එහෙත් රෝහලේ අභියාචනාවකට අදාලව බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2024 අප්‍රේල් 10 දිනැතිව ලබාදී තිබුණු වාර්තාව අනුව වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගෙවිය යුතු බවට රෝහල වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013/2014 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රෝහලේ වෛද්‍ය හා අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වෘත්තිය ගාස්තු මත උපයන විට බදු ගණනය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	
	(ඇ)	අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ස්ථීර වශයෙන් නිලධාරියෙකු පත්කරන තෙක් රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා නිත්‍ය තනතුරේ වැටුපෙන් ¼ ක රාජකාරී ආවරණය කිරීමේ දීමනාවක් ගෙවීමට යටත්ව වැඩ ආවරණය කිරීමේ පදනම් මත 2021 ජූලි 28 දින සිට නිලධාරියෙකු පත්කර තිබුණි. එම නිලධාරියාගේ වැටුප් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ගෙවනු ලබන බවටත් රාජකාරී ආවරණය කිරීමට අදාලව දීමනා පමණක් රෝහල මගින් ගෙවීමටත් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තියට අනුව වැඩ ආවරණය කිරීමේ පත්කිරීමකට අදාලව අතිරේක පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකමක් නොමැති වුවද රෝහල විසින් මෙම නිලධාරියා වෙත 2021 ජූලි 28 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 5.66ක් සහ 2023 සැප්තැම්බර් 30 දක්වා වැඩ ආවරණය කිරීමේ දීමනා ලෙස රු.775,170 ක් ලෙස එකතුව රු.මිලියන 6.43ක මුදලක් ආයතන සංග්‍රහයට පටහැනිව ගෙවා තිබුණි. වැඩ ආවරණය කිරීමේ දීමනාව ගෙවීම 2023 ඔක්තෝබර් මස සිට අත්හිටුවා තිබුණු අතර	මෙම නිලධාරියාට රාජකාරී ආවරණය සඳහා දීමනාවක් ගෙවීම් කර ඇති අතර, එය 2023 ඔක්තෝබර් මස සිට අත්හිට වන ලදී. 2024.01.13 දිනැති ලිපියෙන් වැඩිදුර ගෙවූ දීමනාව අයකර ගන්නා ලෙස ගිණුම් අංශයට දන්වන ලද නමුත් හිටපු සභාපතිතුමාගේ උපදෙස් මත එම අයකිරීම නතර කරන ලදී.

		එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද මෙතෙක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	
	ii.	රෝහලේ ස්ථිර කාර්යමණ්ඩලයේ නිත්‍ය රාජකාරියක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීම හැර වෙනත් රාජකාරියක් පවරා තිබුණු බව තහවුරු කර ගැනීමට රාජකාරී ලැයිස්තුවක් ලබා දී නොතිබියදී යථෝක්ත කාලපරිච්ඡේදය වෙනුවෙන් අමතර රාජකාරී දීමනා ලෙස රු.මිලියන 4.77ක් ගෙවීම් කිරීමහා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 පරිදි වෙන්කල වාහනයක් භාවිතා කිරීමට හිමිකමක් නොමැති මෙම නිලධාරී වෙත ඉන්ධන දීමනා ලෙස රු.මිලියන 1.28ක් ගෙවීම් කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.	මේ වන විට එම නිලධාරියාට රාජකාරී ලැයිස්තුවක් ලබා දී ඇත. රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක PED 01/2015 අනුව මෙම නිලධාරියාට වෙන්කල වාහනයක් භාවිතා කිරීමට හිමිකමක් නොමැති බැවින්, මෙම නිලධාරියාට ගෙවන ලද ඉන්ධන දීමනාව නතර කොට, එම චක්‍ර ලේඛයෙහි 4 ඡේදයට අනුව 2024.02.03 දින සිට නිවසේ සිට රාජකාරී ස්ථානය දක්වා යාමට හා ඒමට සංචිතයේ වාහනයක් සහ රියදුරකු අනුයුක්ත කරන ලදී. එසේ වුවද එදිනම මෙම නිලධාරියා ගමන් වාර 4ක් ධාවනය කිරීම නිසා වැඩි පිරිවැයක් දැරීමට සිදු වන බව දන්වා එම වාහනය ඔහු විසින් ධාවනය කිරීමටත් එය රාත්‍රියේ ඔහුගේ නිවසේ රඳවා ගැනීමටත් හිටපු සභාපතිතුමාගේ අනුමැතිය ලබා ගෙන ඇත.
	iii.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ප්‍රකාරව ස්ථිර නිලධාරියෙකු පත්කරන තෙක් තාවකාලික වශයෙන් මෙම වැඩ ආවරණය කිරීමේ පත්වීම ලබාදී තිබුණද මේ වනවිට වර්ෂ 2 ½ කට අධික කාලයක් සේවයේ යොදවා තිබුණු අතර ස්ථිර පදනමින් පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.	නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට අළුතින් කෙනෙකු බඳවා ගැනීම සඳහා පුවත්පත් නිවේදනයක් පලකොට අයදුම්පත් 4ක් ලැබී ඇති අතර සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පටිපාටියද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. නමුත් දැනට මෙම තනතුරට ගෙවනු ලබන්නේ SL-III වැටුප් පරිමාණයෙන් වන අතර නව බඳවා ගැනීමේ දී SL-I Grade I නියෝජ්‍ය පරිපාලන සේවයේ වැටුප් පරිමාණයට වෙනස් කරන තුරු එය නවත්වා තබා ගැනීමට හිටපු සභාපතිතුමා විසින් වාචික උපදෙස් ලබා දී ඇත.
	ඉ.	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සතුව වාහන 16ක් තිබුණු අතර එම වාහන සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.	
	i.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ජාතික අයවැය චක්‍රලේඛ අංක 150 අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රෝහල වෙත ලබාදී තිබුණු වාහන 06ක් රෝහල වෙත ලැබී වසර 7 ක කාලයක් ඉක්මවා තිබුණද විගණිත දින දක්වා එම වාහන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	වාහන වල අයිතිය පවරා ගැනීමට අදාල ලිපි හා පැවරීමේ පිළිබඳ ප්‍රකාශ (පැවරීමේ ලිපි MTA 06) සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් අදාල වාහන රෝහල වෙත පවරා දීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇති අතර ඒ බව සඳහන් ලිපියක් 23/06/2023 රෝහල වෙත එවා ඇත.

			මෙම වාහන පවරා ගැනීම සම්බන්ධයෙන් අතරමැදියෙක් ලෙස මෙම ආයතනයට මැදිහත් වීමට නොහැකි වී ඇත්තේ, අමාත්‍යාංශයේ වාහන 180ක් මේ යටතේ අමාත්‍යාංශයට පවරා ගැනීමට සිදුවී ඇති බැවින්, එය පවරා ගත් පසුව අප වෙත අයිතිය පවරා දීමට නියමිත බැවිනි. මේ පිළිබඳව වරින් වර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විමසා බලන ලද අතර දැනට පොත් තොගයක් ලැබී තිබෙන බව සඳහන් කෙරුණි. ඉන් අප ආයතනයට අයත් පොත් තෝරා ගැනීමට කටයුතු කරන අතර මෙම සියලුම වාහනවල පැවරීම් කටයුතු කඩිනමින් සිදු කර දීමට කටයුතු කරන ලෙස දන්වමින් අදාල අංශ වෙත සිහි කැඳවීම් ලිපි යොමු කිරීමටත් මේ පිළිබඳව මෝටර් රථ දෙපාර්තමේන්තුවෙන්ද විමසා බැලීමටත් කටයුතු කරමි.
	ii.	හදිසි අනතුරකට ලක්වී තිබුණු මෝටර් රථ සම්බන්ධයෙන් මු.රෙ. 104(1) ප්‍රකාරව මූලික විමර්ශනයක් පවත්වා වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණු අතර අනතුර සිදුවීමෙන් වර්ෂ දෙකකට වැඩි කාලයක් ඉක්මවා අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකිරීම හේතුවෙන් රක්ෂණ ආයතනය විසින් හානි පූර්ණය කර නොතිබුණි. අළුත්වැඩියාව සඳහා පුද්ගලික සමාගමක් විසින් රු.489,200 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද, ඊට අනුව අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු නොවීමෙන් වාහනයට හානි සිදුවී තිබුණු අතර අදාල සමාගම රු.මිලියන 1.73ක නව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. අත්තිකාරම් ලෙස රු. 97,840 ක් ගෙවා තිබුණ ද නිසි කාලසීමාවන් තුළ වාහනය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශාල වියදමක් දැරීමට සිදු වී තිබුණි.	<u>WPKO – 8733</u> Covid 19 වසංගත තත්වය පැවැති කාලය තුල අලුත්වැඩියා සිදුකරනු ලබන ගරාජ වසා තිබීම හේතුවෙන් සහ ප්‍රසම්පාදන කමිටු වලින් නින්දු තිරණ ගැනීමට ගත වූ කාලයත් බලපාන අතර මිලෝයි ආයතනයෙන් ඉදිරිපත් කල මිලණුන් අධික වීම හේතුවෙන් හා අනුමත නොවීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලදී. එහිදී මුදල් අමාත්‍යාංශයේ කොමිට්‍රෝලර්තුමා වෙත ඉදිරිපත් කර ඒ අනුව කටයුතු කරන ලෙස දැනුම්දෙන ලදී. එහිදී අමාත්‍ය මණ්ඩල තීරණයේ පරිදි රජයේ ආයතන වල අලුත්වැඩියා කිරීමට ඇති වාහන, ප්‍රවාහන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් ලක්දිව ඉංජිනේරු සමාගමෙන් සිදු කිරීමට කටයුතු කරන ලෙස දන්වා තිබූ අතර ඒ අනුව මෙම WPKO – 8733 අංක දරණ මෝටර් රථය සී/ස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම වෙත 2022.02.07 දින යොමු කරන ලදී. ඉන් අනතුරුව මෙම මෝටර් රථයේ අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් දිගින් දිගටම විමසීම් කලද සතුටුදායක පිලිතුරක් මෙම ආයතනයෙන් නොලැබීම හේතුවෙන් ලිඛිතව ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කලද මේ වන තුරු එම අලුත්වැඩියා කටයුතු අවසන් කර නොමැත. එබැවින්

			ජා-ඇල, ඒකල පිහිටි සී/ස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම වෙත කිහිප වතාවක්ම ගොස් මෙම මෝටර් රථයේ අලුත්වැඩියා කටයුතු සම්භන්ධයෙන් සොයා බැලීමට කටයුතු කර ඇත. එහිදී අලුත්වැඩියා කටයුතු වල අවසාන අදියරක ඇති මෙම මෝටර් රථය මාසයක් වැනි කාලයක් තුල අලුත්වැඩියා කටයුතු අවසන් කර නැවත රෝහල වෙත ලබා දීමට ඔවුන් කටයුතු කරන බව දැනුම් දී ඇත. •මෙම WPKO – 8733 අංක දරණ මෝටර් රථයේ සිදු වූ අනතුර සම්බන්ධයෙන් එම රථය ධාවනය කල රියදුරු අතින් සිදු වූවක් නොවන බව එවකට සිටි සභාපති, අතුල කහදලියනගේ මහතා සහ එවකට සිටි පාලන නිලධාරී සරත් රොබට්සන් මහතා සහතික කර ඇත. •එය ස්භාවිකව තද වර්ෂාවක් නිසා ඇති වූ සුලඟින් ගේට්ටුවක දොරක් ඇරී වාහනයේ පිටුපස වැදීම නිසා සිදු වූවක් බවත් රියදුරුගේ ප්‍රකාශයේ සඳහන්ව ඇත. •රක්ෂණ හිමිකම මඟින් එම වියදම් ආවරණය කර ගැනීමට අදාල කටයුතු සියල්ල සම්පූර්ණ කර තිබූ නමුත් නියමිත කාල සීමාව තුලදී අලුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් රක්ෂණ වන්දි ලබා දිය නොහැකි බව රක්ෂණ සමාගම විසින් ලිඛිතව දන්වා එවා ඇත.
	iii.	2021 මැයි මාසයේ සිට ධාවනයෙන් ඉවත්කර තිබුණු ගිලන් රථයක් 2022 පෙබරවාරි මස අළුත්වැඩියාව සඳහා යොමුකර තිබුණු අතර එම ගිලන් රථය අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය තුළ රෝහල විසින් රු.මිලියන 1.2 ක් වැයකර තිබුණද වායු සමීකරණ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, පිටුපස දොර අබලන් තත්ත්වයේ පැවතීම හා රථයේ අභ්‍යන්තරය රෝගීන් ප්‍රවාහනයට සුදුසු තත්ත්වයක නොපැවතීම හේතුවෙන් ගිලන් රථයක් ලෙස රෝහලේ කටයුතුවලට යොදවා ගැනීමට නොහැකි වී තිබුණි.	wpLW-0489 ඉහත අංක දරණ ගිලන් රථය අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සී/ස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම වෙත යැවීමට පෙර සිටම පිටුපස දොර අබලන් තත්වයක පැවති ඇත. එය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීමක් කර ගිලන් රථය භාර රියදුරු විසින් ලබා දුන් ලිපිය ගොනුවේ දක්වා ඇත. නමුත් එම අලුත්වැඩියාව හෝ විගණන විමසුමේ සඳහන් (A/C) වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියා කර දෙන මෙන් සී/ස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම වෙත දන්වා නොමැත. එම ආයතනය විසින් සිදු කර ඇත්තේ එන්ජිමට අදාල දෝශය පමණි. නමුත් ගිලන් රථය බොහෝ කාලයක් ගරාජය තුල නවතා තිබීම සහ එන්ජිම සම්පූර්ණයෙන් ගලවා අලුත්වැඩියා කිරීම හේතුවෙන් ඇතුලත

			අපිරිසිදු වීම සහ (A/C) වායු සමීකරණ පද්ධතිය අක්‍රිය වීමද සිදු වී ඇත. එමෙන්ම එන්ජිම පදම්වන කාලය සම්පූර්ණ වන තුරු මෙම රථය සෙමින් ධාවනය කරන ලෙස අලුත්වැඩියාව සිදු කරන ලද ආයතනය විසින් දන්වා ඇති අතර එම උපදෙස් නොතකා රථය ධාවනය කිරීමෙන් එන්ජිමට හානි විය හැකි අතර ඔවුන් විසින් අලුත්වැඩියාව සම්භන්ධයෙන් ලබා දී ඇති වගකීමද අහෝසි වනු ඇත. එම නිසා මෙම ගිලන් රථය දැනට රෝගීන් ගෙන යෑම හැර වෙනත් ලේ ප්‍රවාහනය කිරීම වැනි කටයුතු සඳහා භාවිත කරනු ලබයි. එමෙන්ම විගණන විමසුමෙහි සඳහන් කර ඇති අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා මේ වන විට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.
	ඊ.	2016 නොවැම්බර් 03 දින රු.මිලියන 23.54ක වැටි සහිත මුදලකට පෞද්ගලික ආයතනයක් වෙතින් මිලදී ගෙන තිබුණු සායනික අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රය (Incinerator) වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නඩත්තු සේවා සහ ඉන්ධන හා විදුලිය වෙනුවෙන් එකතුව රු.මිලියන 22.9ක් ගෙවා තිබුණු අතර ජලය සඳහා වැයකල මුදල වෙන්කර හඳුනාගත නොහැකි විය. මෙමගින් දෛනිකව සායනික අපද්‍රව්‍ය කි.ග්‍රෑ. 300 ත් 400 ත් අතර ප්‍රමාණයක් පිළිස්සීම සිදු කරන බව දක්වා තිබුණද සත්‍ය වශයෙන් පුළුස්සන ප්‍රමාණයන් පිළිබඳ වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි. මෙම යන්ත්‍රය උපයෝජනය හා නඩත්තු කටයුතු පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.	
	i.	යන්ත්‍රය මිලදී ගැනීමේදී නඩත්තු සේවා ගිවිසුමකින් තොරව යන්ත්‍රය පමණක් මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබියදී යන්ත්‍රයේ අවුරුදු දෙකක වගකීම් කාලය ඉකුත් වීමෙන් පසු යන්ත්‍රය මිලදීගත් ආයතනය සමඟ නඩත්තු සේවා ගිවිසුමකට එළඹී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට අවස්ථා 03කදී එකතුව රු.මිලියන 6.91ක් සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණි.	මෙම යන්ත්‍රය මිලදී ගැනීම 2016 වර්ෂයේ සිදු වී තිබේ. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් 04 දෙනෙකු සහභාගි වී ඇත. එම ලංසු අනුව පහත පරිදි මිල ගණන් ඉදිරිපත් කර තිබේ.

ලංසුකරු	යන්ත්‍රයේ වියදම	වසර 05 ක සේවා වියදම්
M w Holdings	Rs. 21,210,900.00	Rs. 10,605,450.00
Analytical Instrument Ltd	Rs. 25,522,522.52	Rs. 3,825,000.00
Far East Shred Servicing Ltd	Rs. 17,750,000.00	Rs. 12,487,680.00
P&W Associate Int. Ltd	Rs. 28,597,820.75	Rs. 3,186,100.00

			ඉහත මිල ගනන් අනුව යන්ත්‍රයේ පිරිවැය පමණක් පදනම් කර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලබා දී තිබේ. ඒ අනුව දෙවන අවම මිල ඉදිරිපත් කර තිබූ M W Holdings ආයතනය නිර්දේශ කර ඇත. අවම මිල ඉදිරිපත් කල Far East Service ආයතනය තාක්ෂණික කරුණු මත ප්‍රතික්ෂේප කර ඇත. නමුත් ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී නිර්දේශිත ආයතනයේ වසර 05 ක සේවා පිරිවැය සලකා බලා තිබේ. එහිදී එම ආයතනය සමග සිදුකර ඇති සාකච්ඡාවකදී රෝහල් කාර්යය මණ්ඩලය සඳහා සේවා පුහුණුවක් ලබාදීමට ආයතනය එකඟ වී ඇති අතර ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව සේවා පිරිවැය රහිතව අනුමැතිය ලබා දී තිබේ. නමුත් වසර දෙකක වගකීම් කාලය නිමවීමෙන් පසු රෝහල විසින් සේවා කටයුතු සිදුකල යුතු වුවත් මේ සඳහා සුදුසු සේවා කණ්ඩායමක් පුහුණුකර නොතිබීමත්, ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයේ සේවක මහතුන්ගේ විශ්‍රාම යාම, අභ්‍යන්තර මාරුවීම් හා සේවයෙන් ඉවත්වීමේ හේතු මත සේවක අඩුපාඩු සිදුවිය. එවිට මෙම යන්ත්‍රයේ නඩත්තු කටයුතු නිසියාකාරව සිදුකල නොහැකි බව ජීව වෛද්‍ය ඉංජිනේරුවරයා දන්වා තිබීම මත නඩත්තු සේවා සඳහා වාර්ෂිකව ගිවිසුම්ගතව තිබේ. එහිදී මූලික ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් වලට පරිභාහිර මිළ ගණන් යටතේ ගිවිසුම්ගත වීමට සිදුව තිබේ. මෙම සේවා කටයුතු අනිවාර්යයෙන්ම සිදුකල යුතු වූ බැවින්ද වෙනත් විකල්ප නොමැති බැවින්ද මෙම ආයතනය සමග ගිවිසුම්ගතව සේවා කටයුතු සිදුකර තිබේ.
	ii.	නඩත්තු සේවා සඳහා සැලකිය යුතු මුදලක් වැයකර තිබුණද යන්ත්‍රය මගින් සායනික අපද්‍රව්‍ය නිසි පරිදි පූර්ණ දහනයකට ලක් නොවන බව නිරීක්ෂණය විය. මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රය 2023 නොවැම්බර් 23 දින කල් ඉකුත්ව තිබුණද නඩත්තු සේවා ආයතනය විසින් අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් අප්‍රමාදව සිදු නොකිරීමෙන් ඊට අදාල දුම් සහතිකය ලබාගැනීමට	දහන යන්ත්‍රෙය් දෝෂ වාර්තාවන අවස්ථා වලදී කීප වතාවක්ම අදාල ආයතනය මඟින් අළුත්වැඩියා කරන ලද අතර 2023 නොවැම්බර් දක්වා පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගෙන තිබුණි. 2024.05.21 දින ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් (NERD) පැමිණ මෙම යන්ත්‍රය පරීක්ෂා කල

		නොහැකිවීම හේතුවෙන් බලපත්‍රය අළුත් කරවා ගැනීම ප්‍රමාදවී තිබුණි.	අතර එම වාර්තාව ලැබීමට නියමිතව ඇත. යන්ත්‍රයේ ඉහළ හා පහළ බර්නර් වල උෂ්ණත්වය දැන ගැනීමට ඇති දර්ශන තිරය දෝෂ සහිත වන අතර එක් වරක එක් බර්නර් කොටසක උෂ්ණත්වය පමණක් දර්ශනය වන අතර එයද පිළිගත නොහැකි අගයක පවතින බව NERD ආයතනය මඟින් දන්වන ලදී. 2023.11.22 දින සිට නව සේවා ගිවිසුමකට ඇතුලත් වී අතර NERD ආයතනයේ වාර්තාව අනුව යන්ත්‍රයේ දෝෂ හා අළුත්වැඩියාව පිළිබඳ නිර්දේශ ලැබුණු පසු හැකි ඉක්මනින් සේවා සපයන ආයතනය මඟින් අළුත්වැඩියා කර ගැනිමටත්, පරිසර ආරක්ෂණ බලපත්‍රය හා දුම් සහතිකය ලබා ගැනීමටත් කටයුතු කරමි.
	iii.	2022/2023 වර්ෂයට අදාල කල් ඉකුත් වූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ 4.7 හා 4.8 වගන්ති ප්‍රකාරව දහනය වූ අළු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. විගණනය විසින් සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම අළු අතර අර්ධ වශයෙන් දහනය වූ සායනික අපද්‍රව්‍ය පැවති බව නිරීක්ෂණය වූ අතරඑම අළු පරිසරයට හානිදායක වන අයුරින් විවෘත පරිසරයේ ගොඩගසා තිබීමෙන් වර්ෂා කාලයේදී අවට ඇති ජල මූලාශ්‍රවලට ඒකතුවීමේ අවධානමක් පැවතුණි. එසේම මධ්‍යම පරිසර අධිකාරිය විසින් කරන ලද දැනුම්දීමට අනුව උපද්‍රවකාරී අපද්‍රව්‍ය (Hazardous Waste) කළමනාකරණයට අදාලව අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	සායනික අපද්‍රව්‍ය දහන යන්ත්‍රය (Incinerator) මඟින් ඉවත් කරන අළු මධ්‍යම පරිසර අධිකාරීයේ නීතියට අනුව මධ්‍යම පරිසර අධිකාරීයේ නිලධාරින්ගේ අධික්ෂණය යටතේ පරිසරයට හානියක් නොවන අයුරින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නම් කරන ලද ස්ථානයකට බැහැරලීම සිදු කරන ලදී. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (NERD) වාර්තාවට අනුව මෙම යන්ත්‍රය අලුත්වැඩියා කර ගැනීමෙන් පසුව සායනික අපද්‍රව්‍යවල පූර්ණ දහනයක් අපේක්ෂා කරන අතර ඒ අනුව උපද්‍රවකාරී අපද්‍රව්‍ය (Hazardous Waste) කළමනාකරණ බලපත්‍රයද ලබා ගනිමින් ඉදිරියේදී මෙම දහන යන්ත්‍රය මඟින් ඉවත් කරන අළු මධ්‍යම පරිසර අධිකාරීයේ නිලධාරින්ගේ අධික්ෂණය යටතේ පරිසරයට හානියක් නොවන අයුරින් බැහැර කිරීම සිදු කරන බව දන්වා සිටිමි. දැනට දහන යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ITI ආයතනයෙන් දහන යන්ත්‍රයේ වායු විමෝචන වාර්තාව ලබා ගැනීම සඳහා ඇස්තමේන්තුවක්ද ලබා ගෙන ඇත. ඉදිරියේදී මධ්‍යම පරිසර අධිකාරියෙන් EPL සහ SWM බලපත්‍රය ලබා ගත හැකි බැව දන්වා සිටිමු.

	උ.	කුලී පදනම් මත පවත්වාගෙන යනු ලබන ආයතනවල කුලී ආදායම පරීක්ෂා කිරීමේ දී පහත කරුණු අනාවරණය විය.	
	i.	රෝහල් පරිශ්‍රය තුළ කුලී පදනම් මත ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව වෙතින් පිළිවෙලින් මාසිකව රු.45,000 ක් හා රු.15,000 ක් ලෙස බදු කුලී අයකරගෙන තිබුණද දෙපාර්ශවය අතර ඊට අදාලව ගිවිසුම් ඇති කරගෙන නොතිබුණි.	හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව සමඟ කුලී ගිවිසුමකට අනුව කටයුතු කරන මෙන් අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි.
	ii.	2006 වර්ෂයේදී රෝහලේ ස්ථාපනය කර තිබුණු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමඟ ඇතිකර ගෙන තිබුණු අවබෝධතා ගිවිසුමෙහි කාලානුරූපව කුලී මුදල් වැඩිකරවා ගැනීමට හා නව ගිවිසුම් ඇතිකර ගැනීමට අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර නොතිබීමෙන් 2006 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වාම රෝහල විසින් මාසික කුලී ලෙස රු.85,000 ක් හා 2018 වර්ෂයේ සිට රු.120,000 ක් ලෙස මාසික කුලී අයකර තිබුණි. 2023 ජුනි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් මාසික කුලිය රු.150,000 දක්වා වැඩි කිරීමටත් නව ගිවිසුමක් ඇතිකර ගැනීමටත් තීරණය කර තිබුණද, කුලී මුදල් තීරණය කිරීමට අදාලව තක්සේරු වාර්තා ලබාගැනීමට හා නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.	මුදල් සම්බන්ධව ඇති වගකීම් අනුව රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඔසුසලේ මාසික කුලිය රු.150,000.00 ක් දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී. ඉදිරියේදී තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමි. ඔසුසල සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමටද කටයුතු කරමි.
	iii.	ආහාර අලෙවිසැල් විසින් පරිහරණය කරනු ලබන ජලය වෙනුවෙන් ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ගාස්තුවක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම වෙළඳසැල් වලට ජල මීටර් සවිකර ඉදිරියේදී ජලය පරිභෝජනය සඳහා මුදලක් අය කිරීමට කටයුතු කරමි.
	ඌ.	මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින රෝහල් ගාස්තු බිල්පත් හා තොග සම්බන්ධ (Systolic) පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට (Accpac) ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම හේතුවෙන් පද්ධතිය තුළ පවතින ගැණුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්හි අගයන් වෙනස්වීම මෙන්ම එකම පද්ධතිය තුළ (Systolic) වෙනස් දිනයන්හි ශේෂ වෙනස්වීම් නිරීක්ෂණය වූයෙන් එම අයිතමයන්හි නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපනය වන්නේද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. රෝහලේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම, පරිගණක	Systolic පද්ධතියේ පවතින මෙම ගැටළුව සම්බන්ධව අදාල ආයතනය වෙත දැනුම් දීමට කටයුතු කරමි. මෙම කාලීන වාර්ථා වල එකතුව පසු කාලීනව වෙනස් වීම පිළිබඳව අදාල ආයතනය සමඟ සොයා බැලීමට කටයුතු කරන ලෙස රෝහලේ තොරතුරු තාක්ෂණ අංශයට උපදෙස් දෙමි.

		පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතු වී තිබුණි.	
	ඒ.	රෝහල සඳහා බඳවාගැනීමේ පරිපාටියක් සකස් කිරීමේ කාර්යය 2023 අප්‍රේල් 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් කමිටුවක් වෙත පවරා සමාලෝචිත වර්ෂය තුළ කමිටුව වෙත රු.518,000ක මුදලක් ගෙවා තිබුණු අතර විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තනතුරු 84 කට අදාලව බඳවාගැනීමේ පරිපාටි පිළියෙල කර ඇතත් අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එසේම බඳවාගැනීමේ පරිපාටි 12 කට අදාලව වැටුප් කේතවල නොගැලපීම් හේතුවෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකිවී තිබුණි.	මෙම රෝහලේ තනතුරු නාම 74ක් ඇති අතර ඒවායින් 13ක් හැර අනෙක් සියළුම තනතුරු වලට අනුරූපී තනතුරු සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතී. බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීමට යාමේදී මෙම තනතුරු නාම සහ වැටුප් කේතවල වෙනස්කම් ඇති බව නිරීක්ෂණය වූ බැවින් එම වැටුප් කේතයන් නිවැරදි කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. එම අනුමැතියට යටත්ව බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමට පත් කල කමිටුව විසින් මේ වන විටත් බඳවා ගැනීමේ පරිපාටි කෙටුම්පත් සකසා ඇත. එම කෙටුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා අනුමත කර ගෙන ඉදිරි කටයුතු කරනු ඇත. සියළුම කෙටුම්පත් මේ වන විට සකස් කර අවසන් වී ඇත.
	ඓ.	2023 දෙසැම්බර් 31 දින වනවිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 03ක් සඳහා නිලධාරීන් 266 දෙනෙකු හා අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ එක් තනතුරක් සඳහා නිලධාරීන් 04 දෙනෙකු පත්කර තිබුණි.	මෙම රෝහලේ කලමනාකරණ සහකාර නිලධාරීන් බඳවා ගැනීමේදී MN1 සහ MN2 කේත වෙනස් වීම් නිසාත් Orderly සහ සෞඛ්‍ය කාර්ය සහායක PL1 හා PL2 කාර්ය මණ්ඩලයේ කේත වෙනස් වීම නිසාත් මෙම ගැටළුව පෙන්නුම් කරයි. එසේ වුවද කලමනාකරණ සහකාර (MN1සහ MN2) එකතුව සමහත් (PL1 හා PL2) එකතුව සමහත් ගත් කල කාර්ය මණ්ඩලයේ අතිරික්තයක් ඇති නොවන බව දන්වමි. එසේම Phlebotomist තනතුර මෙතෙක් අනුමත වී නොමැති අතර කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත FR 71 අයදුම්පත් යොමු කරන ලදි. ඒ සම්බන්ධව තවදුරටත් තොරතුරු වාර්තා කරන ලෙස දන්වා ඇත.
	ඔ.	සමාලෝචිත වර්ෂයේ හා වර්ෂ 01 සිට වර්ෂ 05ක කාලයක් තුල ගිවිසුම් කඩකරමින් බැඳුම්කර නොගෙවා සේවය අතහැර ගොස් තිබුණු නිලධාරීන් 26දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 43.22ක බැඳුම්කර මුදල් අයකර ගැනීමේ කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණි.	ගිවිසුම් කඩකල හෙද නිලධාරීන්ගේ ගිවිසුම් ප්‍රකාර බැඳුම්කර අයකර ගැනීමට නීති නිලධාරී වෙත දන්වා නිතීමය පියවර ගෙන ඇත. කොටසකට දැනටමත් නඩු පවරා ඇත.

	ඞ.	සේවය අත්හිටවූ , සේවය අතහැර ගිය හා විදේශගත වූ සේවකයින්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 5.68ක්වූ ආපදා ණය ශේෂය මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම මුදලින් රු.මිලියන 5.12ක් වර්ෂ 2 සිට 7 දක්වා වූ කාල පරාසයක සිට පැවතෙන ශේෂ විය.	මෙතෙක් අයකර ගෙන නොමැති සේවය හැරගිය, සේවය අත්හිටවූ , විදේශගතවූ සේවකයන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් පිළිබඳව තොරතුරු ලබා ගෙන ඇපකරුවන්ගෙන් අයකර ගැනීමටද එසේ නොහැකි ඒවා පිළිබඳව නඩු පැවරීමටද කටයුතු කරමි.
	ක.	1996 ජූලි 17 දිනැති අංක 96/1347/120/143 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ විවිධ ශ්‍රේණි සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමාන්තර ශ්‍රේණි හෝ අනෙකුත් දෙපාර්තමේන්තුවල සමාන්තර තනතුරු අතර වැටුප් පරතරය සියයට 35 ක්වන අයුරින් පවත්වා ගැනීම පොදු ප්‍රතිපත්තියක් ලෙස තීරණය කර තිබුණි. මෙම වැටුප් වැඩිවීම පදනම් කරගෙන 2018 මාර්තු 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු වක්‍රලේඛ යටතේ වෛද්‍ය, හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරී දීමනා හා අතිකාල දීමනා සඳහා 2018 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සියයට 35 වැඩිවීම වක්‍රලේඛයේ සඳහන් රේටයට එකතු කර ගෙවීමට තීරණය කර තිබුණි. ඒ අනුව රෝහලේ වෛද්‍ය කාර්යමණ්ඩලය හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ කාර්යමණ්ඩලය වෙත වක්‍රලේඛයේ සඳහන් අතිරේක රාජකාරී හා අතිකාල දීමනාවට සියයට 35ක් එකතු කර වක්‍රලේඛය මගින් ලබාදෙන දීමනාවට වඩා ඉහළ රේට් අගයක පිහිටුවා පිළිවෙලින් 2021, 2022 හා 2023 වර්ෂවලදී රු.මිලියන 168.43ක්, රු.මිලියන 162.47ක් හා රු.මිලියන 158.07ක් ලෙස ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා තිබුණු බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොදු වක්‍ර ලේඛ යටතේ වෛද්‍ය, හෙද හා පරිපූරක වෛද්‍ය සේවයේ නිලධාරීන් වෙත ගෙවීම් කරනු ලබන අතිරේක රාජකාරී දීමනා සහ අතිකාල දීමනා සඳහා 35% ක් එකතු කර ගෙවීම සඳහා 2018 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය කර ඇත්තේ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් පනතේ අංක 07 ඡේදයේ 2(C) වගන්තිය යටතේ රෝහල් මණ්ඩලයට ඇති බලතල අනුවය.
	ග.	රෝහල් සේවයෙන් 2020 අප්‍රේල් 24 දිනවිශ්‍රාම ගිය පරිපාලන නිළධාරී වෙත රු.284,784ක දඩ මුදලක් ද සහිතව එකතුව රු.මිලියන 2.18ක පාරිතෝෂිකයක් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	මෙම නිලධාරියාගේ පත්කිරීම් හා වැටුප් ගෙවීම සහ තනතුරු නාම අනුමත කර නොගැනීම හා මානව සම්පත් ප්‍රධානී තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන්	මෙම පරීක්ෂණය මූලික විමර්ෂණයක් නොවන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද ඒක පුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඔහුගේ නිරවුල්

		දීමනා ගෙවීම සම්බන්ධයෙන් පිළිවෙලින් 2017 හා 2020 වර්ෂයන්හිදී විගණනය විසින් අවස්ථා 02කදී විගණන විමසුම් නිකුත් කර තිබියදී මූලික විමර්ශනය සඳහා නිලධාරියෙකු පත්කර තිබුණේ නිලධාරියා විශ්‍රාම යාමට නියමිතව තිබූ දිනයට පෙර දිනදීය. මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	සහනිකය ලබා ගැනීමේ දී ඇතිවූ ගැටළුවක් නිරාකරණය කර නිරවුල් සහනිකය ලබා ගැනීමට කරන ලද පරීක්ෂණයකි.
	ii.	මූලික විමර්ශනයට අනුව වැරදි ලෙස උපයාගත් වැටුප් ලෙස ගණනය කරන ලද රු.මිලියන 1.17ක මුදලක් හා විගණන විමසුම ප්‍රකාරව මානව සම්පත් ප්‍රධානී තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් වැරදි ආකාරයට ගෙවූ දීමනා ලෙස අයවිය යුතු මුදල රු.මිලියන 1.58ක් ලෙස එකතුව රු.මිලියන 2.75ක් එම නිලධාරියාගෙන් අයකරගත යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	දීමනා ලෙස ගෙවූ මෙම මුදල අයකර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කලද කම්කරු උසාවියේ එම මුදල තැන්පත් කරන ලෙසට දන්වා තිබුනි. නමුත් අදාල මුදල අයකර ගැනීමකින් තොරව උසාවිය එම මුදල නිදහස් කර තිබුණි.
	iii.	නිළධාරියාගෙන් අයවිය යුතු මුදලට හිලව් කර ගැනීමේ අරමුණින් ඔහුගේ පාරිතෝෂික මුදල් රඳවාගෙන තිබුණද අදාල නිලධාරියා විසින් කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කිරීමෙන් පසු මහේස්ත්‍රාත් උසාවියේ නඩු පවරා තිබුණු අතර එම නඩුවට අදාල නඩු ලිපිගොණුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව අදාල නිලධාරියා වෙත රු.284,784ක දඩ මුදලක්ද සහිතව එකතුව රු.මිලියන 2.18ක පාරිතෝෂික මුදලක් ගෙවා තිබුණි. කළමනාකරණය විසින් කඩිනම් විනය හා නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් වැරදි ලෙස ගෙවූ වැටුප්, දීමනා හා පාරිතෝෂික අධිභාර ඇතුළුව රු.මිලියන 3.04 ක් ගෙවීමට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් නීති අංශය සතුව තිබූ සියලු ලිපිගොනු මේ වන විට රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතේ 13 වන වගන්තිය අනුව පාරිතෝෂිකය අහිමි කළ හැක්කේ යම් සේවකයෙක් ආයතනයට වංචා කිරීම, සේවායෝජක අරමුදල් ව්‍යපහරණය කිරීම, සේවායෝජකයන්ගේ දේපළ වලට ඕනෑකමින් අලාභ කිරීම වැනි හේතු නිසා ඔහුගේ සේවය අවසාන කර ඇත්නම් පමණි. එහෙත් මෙම නිළධාරියා විශ්‍රාම යනතුරු ඉහත සඳහන් චෝදනා වලට වරදකරු කර ඔහුගේ සේවය අත්හිටුවා නොමැත. එබැවින් පාරිතෝෂික පනත ප්‍රකාරව පාරිතෝෂික මුදල් ගෙවන ලෙස මහේස්ත්‍රාත් අධිකරණයෙන් සිතාසි මගින් නියෝග කර ඇත. එවැනි අවස්ථාවක පාරිතෝෂික ගෙවීම් නොකර හැරීමෙන් පාරිතෝෂික පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව වරදකරු වන අතර දඩයකට හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකිය. පාරිතෝෂිත මුදල් අයකර ගැනීමට මහේස්ත්‍රාත් අධිකරණයේ පාරිතෝෂික පනත ප්‍රකාරව නඩු පවරා තිබූ අතර උක්ත පනත ප්‍රකාරව ගෙවිය යුතු පාරිතෝෂික ගෙවීමට සිදුවිය.

	ව.	සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක රෝහලේ සමස්ත කාර්ය සාධනය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහලේ ඇඳන් සංඛ්‍යාව සියයට 5.3 කින් හා ඇඳන් භාවිතය සියයට 10 කින් අඩු වී නිබුණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඇඳන් සංඛ්‍යාව නොවෙනස්ව පැවති අතර, ඇඳන් භාවිතය සියයට 4 කින් වැඩි වී නිබුණි.	2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහල් ඇඳන් සංඛ්‍යාවේ සමස්ථ අඩුවීම ඇඳන් 57 කි. එයින් 14 ක් වාට්ටු අංක 01 යටතේ අඩුවී ඇත. 2019 වර්ෂයේ වාට්ටු අංක 01 හි එක් කියුබිකල් (cubicle) එකක ඇඳන් 10 බැගින් ස්ථානගතකර තිබී ඇති අතර රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ලගා වීමට ඇති අපහසුව හේතුවෙන් 2022 වර්ෂයේ සිට එම එක් කියුබිකල් (cubicle) එකක ඇඳන් සංඛ්‍යාව 10 සිට 08 දක්වා අඩුකිරීම මෙම ඇඳන් 14 අඩුවීමට හේතු වී ඇත. වාට්ටු අංක 07හි ඇඳන් සංඛ්‍යාව 21 කින් අඩුවී ඇති අතර කියුබිකල් (cubicle) 02 ක ඇඳන් 16 ඉවත් කර කොවිඩ් සමයේ භාවිතා කිරීමට ඇඳන් තුනක් සහිතව දැඩි සත්කාර ඒකකයක් සැකසීම සහ එම වාට්ටුවේ ඇඳන් 06 ඉවත්කර එක් කියුබිකල් (cubicle) එකක මවුකිරි කළමනාකරණ ඒකකය සැකසීම මෙම ඇඳන් 21 අඩුවීමට හේතුවී ඇත. වාට්ටු අංක 09 හි 2019 සාපේක්ෂව 2023 හිදී 11 අඩුවී ඇති අතර එම වාට්ටුවේ පැවති ඇඳන් ඉවත්කර නව ඇඳ්න් ආදේශ කිරීමේ දී සහ එම වාට්ටුවේ එක් කියුබිකල් (cubicle) එකක් HDU එකක් බවට පත්කිරීම තුළින්ද Urodynamic පරීක්ෂණ සඳහා වාට්ටුවේ ඇඳන් දෙකක් වෙන්කිරීම තුළින්ද මෙම ඇඳන් 11 අඩුවීමට හේතුවී ඇත. මෙයට අමතරව වාට්ටු අතර ඇඳන් හුවමාරු වීම්ද සහිතව සුළු වශයෙන් ඉතිරි ඇඳන් සංඛ්‍යාව අඩු වැඩි වී ඇත. එසේ වුවද ඇඳන් භාවිතය සියයට 59 ක පමණ පවතින බැවින් ඇඳන් සංඛ්‍යාව අඩු වීම, රෝගී සත්කාරය සඳහා බලපෑමක් වී නොමැත. 2019 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ ඇඳන් භාවිතය සියයට 10 කින් අඩුවී ඇති බව නිවැරදි වුවත් 2019 වර්ෂයෙන් පසු කොවිඩ් වසංගත තත්වය හමුවේ රෝගීන් ඇතුළත්වීම පහල යාමක් සිදුවූ බැවින් එම තත්වයට මුහුණ දෙමින් 2020 වර්ෂයේ සිට

			2023 දක්වා ඇඳන් භාවිත අනුපාතය 52%, 54%, 55%, 59% වශයෙන් අඛණ්ඩ වර්ධනයක් රදවා ගැනීමට වර්තමාන කළමණාකාරිත්වය කටයුතු කර ඇත.
	ii.	2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ රෝහලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව, සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව හා බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 17, 11 හා 30 කින් වර්ධනය වී තිබුණි.	රෝහලට ඇතුළත් වූ රෝගීන් සංඛ්‍යාව, සායන සඳහා පැමිණි රෝගීන් සංඛ්‍යාව හා බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව වර්ධනය වී ඇත.

විගණන කමිටු වාර්තාව-2023

විගණන කමිටු වාර්තාව

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ විගණන කමිටුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සිය වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවන ලද විගණන කමිටුව, රෝහලේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන සහ විගණන ක්‍රියාවලීන්හි ශක්තිමත් බව පාරදෘෂ්‍ය භාවය, සහ ඵලදායීබව සහතික කරනුවස් මනා කැපවීමෙන් කටයුතු කරයි.

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ:

- **ඒ.පී කුරුම්බලපිටිය මහතා**
  සභාපති - විගණන කමිටුව
  (අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය)

- **සුනිල් ගලගම මහතා**
  සාමාජික - විගණන කමිටුව
  (අතිරේක ලේකම් – සංවර්ධන, සෞඛ්‍ය අමාත්‍යාංශය)

- **වෛද්‍ය චිත්‍රාන්ගා කාරියවසන් මෙය**
  සාමාජික - විගණන කමිටුව
  (ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ රක්තවේද විශේෂඥ වෛද්‍ය)

සාමාජිකයන් මනා කැපවීමෙන් තම වගකීම් ඉටුකර ඇත.

රැස්වීම

2023 වර්ෂය තුළ විගණන කමිටුව විසින් රැස්වීම් හයක් (06) පවත්වන ලදී. රැස්වීම් පවත්වන ලද දිනයන් පහත පරිදි වේ.

කාර්තුව	දිනය
1 වන කාර්තුව	2023 ජනවාරි 19
2 වන කාර්තුව	2023 අප්‍රේල් 24 2023 ජූනි 14 2023 ජූනි 26
3 වන කාර්තුව	2023 ඔක්තෝබර් 11
4 වන කාර්තුව	2024 ජනවාරි 23

ප්‍රධාන වගකීම් සහ ක්‍රියාකාරකම්

විගණන කමිටුවේ මූලික වගකීම් තුළ පහත සඳහන් කටයුතු ඇතුළත් වේ:

1. **මූල්‍ය වාර්තාකරණය :**

    - රෝහලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවීම පිළිබඳ සහතික කිරීම සඳහා සමාලෝචනය කිරීම.
    - වැදගත් මූල්‍ය වාර්තාකරණ ගැටළු සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකාරිත්වය විසින් සිදු කරන ලද විනිශ්චයන් පිළිබඳ තක්සේරු කිරීම.

2. **අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය:**

    - රෝහලේ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය පිළිබඳ ඇගයීම.
    - රෝහලේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම.

3. **බාහිර හා අභ්‍යන්තර විගණන:**

    - ජාතික විගණන කාර්යාලය මගින් පවත්වන ලද බාහිර විගණනයේ ප්‍රතිඵල සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
    - අභ්‍යන්තර විගණන වාර්තාවල නිර්දේශ සමාලෝචනය කර අවශ්‍ය පියවර ගැනීම.

4. **අනුකූල වීම:**

    - අදාළ නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල වීම පිළිබඳ සහතික කිරීම.

නිගමනය

විගණන කමිටුව ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කරයි. වසර පුරාවට දක්වන ලද සහයෝගීතාවය සහ කැපවීම වෙනුවෙන් කළමනාකාරිත්වයට සහ කාර්ය මණ්ඩලයට අපගේ කෘතඥතාවය පලකර සිටිමු.

විගණන කමිටුව වෙනුවෙන්,

ඒ.පී. කුරුම්බලපිටිය මහතා
සභාපති
විගණන කමිටුව
දිනය: 2024 අගෝස්තු 14

6. ඉදිරි දැක්ම

6.1 ආයතනයේ කාර්යසාධන වර්ධනයසඳහා අපේක්ෂිත මධ්‍යම කාලීන ක්‍රියාකාරකම්

අරමුණු	ක්‍රියාකාරකම්
ඉහළ ම ඉල්ලුමක් ඇති සේවාවන් හඳුනා සංවර්ධනය කිරීම	හඳුනාගත් සේවාවන් හි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
හදිසි අනතුරු හා හදිසි අවස්ථා සඳහා ධාරිතාව වැඩි දියුණු කිරීම	♦ හඳුනාගත් උපකරණ සහ පරිභෝජනීය ද්‍රව්‍ය සැපයීම ♦ ඇතුලුවීමේදී ම රෝගීන් තෝරාගැනීම,ශක්තිමත්කිරීම සහ අඛණ්ඩ සමාලෝචනය
පවත්නා බාහිර රෝගී අංශයේ සේවාවන් ව්‍යාප්ත කිරීම	♦ පහසුකම් වෙන් කිරීම (බාහිර රෝගී අංශය ව්‍යාප්ත කිරීම හා වෙනත් තැනකට ගෙනයාම) ♦ පාරිභෝගිකයන් සඳහා ඵලදායීසහ කාර්යක්ෂම සේවාවක් සැපයීම ♦ පාරිභෝගිකයන්ගෙන් සේවාව පිළිබඳ අදහස් ලබා ගැනීම ♦ අඛණ්ඩ ව ඇගැයීම හා අධීක්ෂණය කිරීම
පරිපූරක වෛද්‍ය සේවා ව්‍යාප්ත කිරීම	♦ භෞතචිකිත්සක සේවාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ♦ නව සේවාවන් හඳුන්වා දීම (පුනරුත්ථාපන)
හඳුනාගත් විශේෂිත ප්‍රතිකාර සඳහා නව ඒකක ස්ථාපනය	♦ ඇන්ජියෝ සී.ටී. යන්ත්‍රය ♦ ජපාන ප්‍රදානයේ දේශීය කොටස (මිලියන 300) - දන්ත වෛද්‍ය ඒකකය සඳහා උපකරණ, දන්ත එක්ස් කිරණ යන්ත්‍රය, ඇන්ජියෝ සී.ටී. කාමරය, හෘත් කැතීටකරණ පරීක්ෂණාගාරය, මිල දී ගැනීම
පූර්ව රෝහල් සේවා සහ නිවෙස් බැහැදැකීම් හඳුන්වා දීම	♦ කණ්ඩායමක් පත් කිරීම ♦ යෝජනාව සැකසීම ♦ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම ♦ මාර්ගෝපදේශයන් පිළියෙල කිරීම ,නිවෙස් බැහැදැකීම් ක්‍රියාවට නැංවීම (එළිපත්තේ සත්කාරය) ♦ ප්‍රගති සමාලෝචනය

අරමුණු	ක්‍රියාකාරකම්
දූර ප්‍රතිකාර ඒකකය ස්ථාපනය	♦ දූර ප්‍රතිකාර ඒකකය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ♦ දූරප්‍රතිකාර සේවය වැඩසටහන්ගත දැනුවත්බව හඳුන්වාදීම ♦ මාර්ගගත ගෙවීම් පහසුව සහිත දූරප්‍රතිකාර පොදි සැකසීම ♦ සෘජු දූරකථන අංකයක් සහිත ප්‍රතිචාර කණ්ඩායමකට පැවරීම
පාරිභෝගික අවශ්‍යතාවට ගැලපෙන ලෙස පරීක්ෂණාගාර සේවාවන් ප්‍රශස්තිකරණය	♦ පහසුකම් පූර්ණ ධාරිතාවෙන් ප්‍රයෝජනයට ගැනීම ♦ ද්‍රව්‍ය සැපයුම් දාමය ශක්තිමත් කිරීම ♦ නියැදි එකතු කිරීමේ හා නිවෙස් බැහැදැක නියැදි එකතු කිරීමේ සේවාවන් ස්ථාපනය
විදෙශීය සිසුන් සඳහා රෝගීන් කළමනාකරණය පිළිබඳ නව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම	♦ මහකොමසාරිස් කාර්යාල/සංචාරක නියෝජිතායතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ♦ විදේශීය හා දේශීය පෞද්ගලික සරසවි සමඟ හවුල් ව්‍යාපාර ඇති කර ගැනීම ♦ වැඩසටහන් සම්බන්ධීකාරකයකු පත්කර ගැනීම ♦ පුහුණු වැඩසටහන් හා කාර්ය සටහන් නිර්මාණය ♦ හවුල්කාර සරසවි වෙතින් ශිෂ්‍යයන් බඳවා ගැනීම ♦ ශිෂ්‍යයන් හා වෘත්තිකයන් බවට පත් විය හැකි අය පිළිබඳ ව දැනුවත් කිරීම
සේවාදායකයන් විය හැකි අයගේ සෞඛ්‍ය අවශ්‍යතා ගැන දැනුවත්වීම	♦ වෙළෙඳපොළ හඳුනාගැනීමට කණ්ඩායම පත්කිරීම ♦ සමීක්ෂණය සඳහා මුදල් වෙන් කිරීම ♦ වෙළෙඳපොළ සමීක්ෂණය පැවැත්වීම ♦ පාරිභෝගික අවශ්‍යතාව හඳුනාගැනීම ♦ රෝහලේ පිරිවටන සැලසුමට පාරිභෝගික අවශ්‍යතා ඇතුළු කිරීම
අලෙවිකිරීමේ සැලසුම සැකසීම	♦ යෝජනාවට අනුමැතිය ලබාගැනීම ♦ අරමුදල් වෙන් කිරීම ♦ ටීඕ සූදානම් කිරීම ♦ අලෙවි කිරීමේ කණ්ඩායම තේරීම ♦ සැලසුම පිළියෙල කිරීම ♦ සැලසුමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීම ♦ සැලසුම ක්‍රියාත්මක කිරීම ♦ රෝහල් මණ්ඩලවලට වාර්තාව හා නිර්දේශ යොමු කිරීම ♦ ක්‍රියාකාරකම් ♦ ක්‍රියාකාරකම්
මූලික පහසුකම් හා සේවා පරිසරය සඳහා ප්‍රමිතීන් ස්ථාපනය	♦ හඳුනාගැනීමෙන් පසු කමිටුවක් පත් කිරීම ♦ ජාත්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුකූල ව ප්‍රමිතීන් සැකසීම ♦ පවත්නා සේවා පරිසරය ප්‍රමිතීන් සමඟ සැසඳීම ♦ අවශ්‍ය වෙනස්කම් සිදු කරමින් ප්‍රමිතීන්ට අනුකූල වීම ♦ අධීක්ෂණය හා ඇගැයීම මඟින් වැඩිදියුණු කිරීම් අඛණ්ඩ ව කරගෙන යාම

අරමුණු	ක්‍රියාකාරකම්
සම්ප්‍රයුක්ත මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය ස්ථාපනය	♦ මිල තීරණය කිරීමට වගකිව යුතු පුද්ගලයකුට පැවරීම ♦ මිල නියම කිරීමේ ක්‍රමයක් සැකසීම ♦ මිල ගණන් සසඳා බැලීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීම ♦ තරගකරුවන්ගේ මිල ගණන් සැසඳීම ♦ කලින් කල මිල ගණන් යාවත්කාලීන කිරීම
බලශක්ති විගණනයක් සිදුකොට එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම	♦ බලශක්ති විගණනය සිදු කිරීම ♦ වාර්තාව විශ්ලේෂණයට කමිටුවක් පත් කිරීම ♦ බලශක්ති උපරිමකරණ සැලසුම සකස් කිරීම ♦ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීම ♦ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම
රෝගී සත්කාර සේවා නොවන සේවා සඳහා විකල්ප ජල මූලාශ්‍ර ගවේෂණය	♦ වැසි ජලය රැස්කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීම ♦ රෝගීන්ගේ සේවාවන් නොවන සේවාවල ජල සැපයුම සඳහා අවශ්‍යතා විශ්ලේෂණයක් පැවැත්වීම ♦ වැසි ජලය රැස්කිරීම සඳහා අය වැය සමඟ යෝජනාවක් සකස් කිරීම ♦ වැසි ජලය රැස්කිරීම සඳහා ටැංකි සහ ඒවා සවිකිරීමට කොන්ත්‍රාත්තු ලබා දීම ♦ වැසි ජලය රැස්කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා පද්ධතිය ක්‍රියාත්මක කිරීම	♦ ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීම ♦ ඉ.වෛ.වා. සඳහා අවශ්‍යතා විශ්ලේෂණයක් කිරීම ♦ රෝහලේ රෝ.තො.ක.ප. තුළ ඉ.වෛ.වා. මොඩියුලය සැකසීම ♦ ඉ.වෛ.වා. පද්ධතිය සඳහා දෘඪාංග මිල දී ගැනීම ♦ රෝහල් කාර්ය මණ්ඩලයට ඉ.වෛ.වා. පිළිබඳ පුහුණුව ලබා දීම. ♦ සායන සඳහා ඉ.වෛ.වා. පද්ධතිය හඳුන්වා දීම ♦ වාට්ටු සඳහා ඉ.වෛ.වා. හඳුන්වා දීම
විකිරණවේද මූර්තනය සඳහා ඡායාරූප අධිලේඛනකරණ හා සන්නිවේදන පද්ධතිය(PACS) සහ විකිරණවේද තොරතුරු පද්ධතිය හඳුන්වාදීම	♦ PACS සහ RIS ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීම ♦ රෝහලේ PACS සඳහා අවශ්‍යතා විශ්ලේෂණයක් කිරීම ♦ PACS සහ RIS පද්ධති සඳහා අවශ්‍ය දෘඪාංග මිල දී ගැනීම ♦ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් PACS සහ RIS පද්ධති සඳහා ඉල්ලීම් කිරීම ♦ රෝහලේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයට PACS සහ RIS පද්ධති පිළිබඳ පුහුණුවක් ලබා දීම ♦ රෝහලේ HIMS තුළට PACS සහ RIS පද්ධති සංකලනය ♦ රෝහල තුළ PACS සහ RIS පද්ධති ක්‍රියාත්මක කිරීම
ජල හා විදුලිබල සැපයුම් පද්ධති ඉහළ මට්ටමට ගැනීම	♦ ජල හා විදුලි සැපයුම්වල වත්මන් ගැටළු හඳුනා ගැනීමට විගණනයක් කිරීම ♦ මැදිහත්වීම් සැලසුමට තාක්ෂණික කමිටුවක් පත්කිරීම ♦ ජල හා විදුලි සැපයුම් පද්ධති ඉහළ මට්ටමට ගැනීමට සැලසුම් සැකසීම ♦ අවශ්‍ය දෘඪාංග මිල දී ගැනීමට අයවැය සැකසීම හා මිල දී ගැනීම ♦ විශ්ලේෂිත වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම

අරමුණු	ක්‍රියාකාරකම්
වඩා හොඳ කාර්ය සාධනය සඳහා යන්ත්‍ර සහ උපකරණ උපරිම ලෙස යොදාගැනීම	♦ කාර්ය සාධනය මැන බැලීම සඳහා කාර්ය අධ්‍යයනයක් සිදු කිරීම ♦ නිර්දේශ ඉදිරිපත් කරනු පිණිස විශේෂඥ කමිටුවක් පත් කිරීම ♦ යන්ත්‍ර හා උපකරණ ප්‍රශස්ත ලෙස සේවයේ යෙදවීම සඳහා අයවැය සකස් කිරීම
කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණය සහතික කිරීම	♦ පවත්නා සහ අනාගත අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා කණ්ඩායම්/කණ්ඩායමක් පත් කිරීම ♦ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ඇගැයීම ♦ එක් එක් ප්‍රභේදය පිළිබඳ ව වෙන වෙන ම තාක්ෂණික වාර්තාව විශ්ලේෂණය කිරීම ♦ හඳුනාගත් ගැටළු නිරාකරණය සඳහා පිරිවැය තක්සේරු කිරීම
ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රති-ඉංජිනේරුකරණය	♦ කණ්ඩායමක් පත් කිරීම ♦ දෘඩ මෙහෙයුම් ව්‍යූහය නම්‍යශීලී ව්‍යූහයන් බවට පත් කිරීමට සැලසුම් කිරීම ♦ තීව්‍රතර තො.ස.තාක්ෂණය භාවිත කිරීම ♦ වැදගත් ක්ෂේත්‍රයන්හි වෙනස්කම් සිදු කිරීම
රෝගී සත්කාර සේවාවන්හි කඩිසර බව වැඩි කිරීම	♦ නිරීක්ෂණ අධ්‍යයනයක් කිරීමෙන් පවත්නා සංස්කෘතිය හැඳින ගැනීම ♦ හඳුනාගත් හිඩැස් අර්ථ දැක්වීම ♦ උචිත මැදිහත්වීම් සැලසුම් කිරීම ♦ රෝහියා කේන්ද්‍ර කොට ගත් සත්කාරය පෝෂණයට සැලසුම් කළ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම
සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශවීමේ දී ඇති ප්‍රමාදයන් අවම කිරීම	♦ රෝගීන් හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් හිඩැස් හඳුනා ගැනීම ♦ සේවා පරිසරයේ පමාවන් අවම කිරීමට කඩදාසි රහිත ප්‍රවේශ සැලසුම් කිරීම ♦ මාර්ගගත වෙන්කරගැනීම් සමඟින් කඩදාසි රහිත සේවා සැපයීම ක්‍රියාවට නැංවීම

අරමුණු	ක්‍රියාකාරකම්
රෝගියා කේන්ද්‍රීය සත්කාර සංස්කෘතිය පෝෂණය කිරීම	♦ නිරීක්ෂණ අධ්‍යයනයක් කිරීමෙන් පවත්නා සංස්කෘතිය හැඳින ගැනීම ♦ හඳුනාගත් හිඩැස් අර්ථ දැක්වීම ♦ උචිත මැදිහත්වීම් සැලසුම් කිරීම ♦ රෝහියා කේන්ද්‍ර කොට ගත් සත්කාරය පෝෂණයට සැලසුම් කළ මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම
සියලු සේවකයන් සඳහා සතත වෘත්තීය දියුණුව ප්‍රශස්ත කිරීම	♦ පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම් මඟින් පුහුණුව අවශ්‍ය ක්ෂේත්‍රයන් හඳුනාගැනීම ♦ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම ♦ සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාවට නැංවීම
පර්යේෂණ හා සංවර්ධන සංස්කෘතිය වඩාත් සඵල කිරීම	♦ ආචාර ධර්ම කමිටු ස්ථාපනය කිරීම ♦ චර්යානුගත සමාලෝචන පැවත්වීම ♦ පර්යේෂණ කෙරෙහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා රෝහල තුළ පර්යේෂණ සංස්කෘතියක් පෝෂ්‍ය කිරීම ♦ පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය පැවැත්වීම
ගුණාත්මක රෝගී සත්කාර සේවාවන්හි සම්මතයන් ස්ථාපනය	♦ තත්ත්ව කව ස්ථාපනය, WIT, ආදිය ♦ 5S, කායිසෙන් සංකල්ප ගැන පුහුණුව ♦ වත්මන් තත්ත්වය, අනාගත තත්ත්වය හා සැසඳීමට සම්මතය සැකසීම ♦ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ පුහුණු කිරීම් ක්‍රියාවට නැංවීම
නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වීම සහතික කිරීම	♦ වත්කම් කළමනාකරණයේ නෛතික අවශ්‍යතා හඳුනාගැනීම ♦ වත්කම් අනුකූලතාව පිළිබඳ වාර්තා කිරීමට කණ්ඩායමක් පත් කිරීම ♦ වාර්තාව සමාලෝචනය හා නිර්දේශයන් අදාළ කර ගැනීම
ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම	♦ වත්කම් කළමනාකරණයට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් හඳුනාගැනීම ♦ අනුකූලතාව සමාලෝචනයට කණ්ඩායමක් පත් කිරීම හා වාර්තා කිරීම

අරමුණු	ක්‍රියාකාරකම්
වත්කම් කළමනාකරණ තොරතුරු පද්ධතිය	♦ වත්කම් කළමනාකරණය සඳහා අවශ්‍යතා විශ්ලේෂණය ♦ වත්කම් කළමනාකරණ මොඩියුලය HIMS හි ඇතුළත් කරනු සඳහා සැලසුම් කිරීම හා අයවැය සැකසීම ♦ වත්කම් කළමනාකරණ පද්ධතිය සැකසීම
පහසුව නඩත්තු කිරීමේ පද්ධතියේ කාර්යක්ෂම බව සහතික කිරීම	♦ නඩත්තු පද්ධතියේ ඇති සංඝටක සියල්ල ලයිස්තුගත කිරීම ♦ තාක්ෂණික කමිටුවක් පත් කිරීම ♦ යන්ත්‍ර සහ උපකරණ නඩත්තුව පිළිබඳ මාර්ගෝපදේශයන් සැදීම ♦ එක් එක් උපකරණය සම්බන්ධයෙන් වෙන වෙන ම වාර්තා පවත්වා ගැනීම ♦ නියෝජිතයන් සමඟ සේවා ගිවිසුම් යාවත්කාලීන කිරීම
ජාතාන්තර සම්මතයන් සමඟ අනුකූලවීම පවත්වාගෙන යාම සහ උසස් කිරීම	♦ තොරතුරු රැස්කිරීමට විගණනය කිරීම ♦ කමිටුවක් පත් කිරීම ♦ සාමාජිකයන් හා තාක්ෂණික විශේෂඥයන් සමඟ රැස්වීම් පැවැත්වීම ♦ ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුගමනය කරමින් නිර්දේශයන් සහිත වාර්තාවක් පිළියෙල කිරීම ♦ රෝහල් මණ්ඩලය මඟින් වාර්තාව අනුමත කරවා ගැනීම ♦ සකසන ලද කාර්ය සටහනකට අනුව නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම
පද්ධතීන් නවීකරණය කිරීම	♦ විශේෂඥයන්ගේ කමිටුවක් පත් කිරීම ♦ විගණනයක් සිදු කිරීම ♦ සැලසුමක් සකස් කිරීම ♦ එය වාර්ෂික සැලසුමට සහ අයවැයට ඇතුළත් කිරීම ♦ අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කිරීම
නිසි සන්නිවේදනය සහතික කිරීම	♦ සන්නිවේදනයේ අඩුලුහුඩුකම් හඳුනා ගැනීම ♦ යෝග්‍ය ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කිරීම ♦ වැඩමුළු හා පුහුණු කිරීම් ක්‍රියාත්මක කිරීම ♦ දුර්වලතා නිවැරදි කිරීමට ක්‍රියාත්මකවීම

- බාහිර රෝගී අංශයේ පවත්නා වැසිකිළි සමූහය නැවත සැකසීම
- වාට්ටු 02, 03, 05, 06 හා NICU වැසිකිළි ගොඩනැගිල්ල
- පරිපාලන ගොඩනැගිල්ල සඳහා අභ්‍යන්තර කාර්යයන්, ELV පද්ධතිය, ජාල අභ්‍යන්තර පද්ධතිය
- CTOT සඳහා මළනොකන වානේ දොරවල්
- ප්‍රධාන පොම්ප පද්ධතිය නැවත සැකසීම
- ජනක යන්ත්‍ර කාමරය ඉදිකිරීම
- ජපාන ගොඩනැගිල්ල සහ නව පොරොත්තු සිසිල්කරණය ද ඇතුළු ව හෘද අංශ ගොඩනැගිල්ලේ වායු සමීකරණ පද්ධතිය නවීකරණය
- වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, HIS පද්ධතිය, වෛද්‍ය වාර්තා පද්ධතිය, EMS, වත්කම් කළමනාකරණ පද්ධතිය
- ගිනි ආරක්ෂණ හා අනාවරණ පද්ධතිය සවි කිරීම
- JAICA ප්‍රදානයේ දේශීය කොටස මඟින් සූර්යකෝෂ පද්ධතියක් සවි කිරීම
- ජපාන ප්‍රදානයේ දේශීය වැය යටතේ දන්ත ඒකකය ස්ථාපනය කිරීම සඳහා වන ඉදිකිරීම් කටයුතු